
ඔබ
වෙනුවෙන්
දියුණු රටක්
නාමල් රාජපක්ෂ
நாமல் ராஜபக்ச
Namal Rajapaksa
X

# නාමල් දැක්ම



## ඔබ වෙනුවෙන් දියුණු රටක්

ගෞරවනීය ස්වාමීන් වහන්ස, පූජකතුමනි, සහෝදරයා, සහෝදරිය,

## දියුණු රටක් හදන මාගේ දැක්ම

නිදහසින් පසු ගතව ඇති වසර 76 ක කාලය තුළ ජනතා අභිලාෂයන් මුදුන් පත් කළ ස්වර්ණමය යුගය ලෙස සනිටුහන් වී ඇත්තේ වසර 2005—2014 දශකයයි. අපගේ මාතෘභූමිය වෙනුවෙන් එදා අතිගරු මහින්ද රාජපක්ෂ ජනපතිතුමන් සිය අප්‍රතිහත ධෛර්යයෙන් සහ නිර්භීත නායකත්වයෙන් ඉටු කළ අසීමිත සේවය විසින් මෙරට දේශපාලනයේ පරමාර්ථයම, සිය දහස් වාරයකින් උතුම්ව පාරිශුද්ධව ජන හදවත් මත රන් අකුරින් ලියැවුණි. ලක් දෙරණට උරුමව තිබුණු දියුණුව වසර 30 ක් පුරා බිඳ දැමූ කුරිරු යුද්ධය මානුෂීය මෙහෙයුමකින් සදහටම අවසන් කර සියලු ශ්‍රී ලාංකිකයන්ට එකම රටක සමගියෙන් ජීවත් වීමේ ගෞරවාන්විත නිදහස උදා කළේ අපේ පරමාදර්ශී නායකයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා විසිනි.

ඉන් නොනැවතුණු එතුමා ඒ නිදහස් ශ්‍රී ලංකාවේ අති දැවැන්ත සංවර්ධන විප්ලවයක් අරඹමින් දියුණු රාජ්‍යයක් කරා අප ඔසවන මහින්ද චින්තන ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ දියත් කළේය. විවිධත්වයෙන් අනූනව සමානත්වයෙන් ඔද වැඩුණු සියලු ලක් වැසියෝ සුබ අනාගතයක පෙර නිමිති දකිමින් මුළු රටම එකම වැඩබිමක් කොට ලොව වේගයෙන්ම වර්ධනය වන රාජ්‍යය බවට ලංකාව පත් කළෝය. කොළඹ වරාය නගරය, හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ වැනි නවීන උපායමාර්ගික ජාතික සම්පත් අප විසින් ගොඩනගන ලද්දේ සුපැහැදිලි ආර්ථික වර්ධන ඉලක්කයන් සහිත දිගුකාලීන සැලසුමක් මතය. අධිවේගී මාර්ග සහ සැතපුම් ගණන් දිග පාලම් ඇතුළු රටම ආවරණය කරන ප්‍රවාහන පද්ධතිය ඉදි කළේ උතුර දකුණ යා කරමින් සංවර්ධනයේ මහඟු අවස්ථා සහ ප්‍රතිලාභ සමස්ථ ජනතාවට බෙදා දීමටය. නව විදුලි බලාගාර සහ වාරිමාර්ග ඉදි කළේ එම සංවර්ධන අවශ්‍යතාවයන් සපුරාලීමටය. නෙළුම් කුළුණ වැනි විස්කම් ඉදි කළේ තරුණ පරපුරට නූතන තාක්ෂණික පහසුකම් ලබා දීමටය. ඒ සියල්ල වෙන් වෙන්ව කළ සංවර්ධනයන් නොවේ. ඒවා එකිනෙකට සහසම්බන්ධ තිරසාර ජාතික සම්පත්ය.

එහෙත් වසර 2015 දී සිදු කළ ආණ්ඩු පෙරළියෙන් පත් වූ ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාව නැවතත් අඳුරු යුගයකට ඇද දැමිණි. රණවිරුවන් දිවි පුදා දිනා ගත් නිදහසේ සංවර්ධනය වසර හතරක් වැනි කෙටි කාලයක් තුළ සම්පූර්ණයෙන් ඇණ හිටිණි. රාජ්‍ය ණය ප්‍රමාණය ඉහළ ගොස් වසර 2019 වන විටත් රටේ ආර්ථිකය බිඳ වැටීමට ආසන්නව තිබිණි. රාජ්‍ය ආරක්ෂාව දුර්වලව ගොස් අවසානයේ ත්‍රස්තවාදය හිස එස වූයේය. ලංකාව නැවතත් බිහිසුණු ඉරණමකට පත් විය.

එසේ බිඳ දැමූ අපේ මාතෘභූමිය නැවත ගොඩනගන්නට වසර 2020 දී ඔබ විසින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරවූයේ මහත් බලාපොරොත්තුවකිනි. ලක් දෙරණ නැවත හිස ඔසවන්නට පටන් ගත්තා පමණී. කෝවිඩ්-19 මාරක වෛරසය විසින් අපේ රටත් සමස්ථ ලෝකයත් වසර දෙකක් තිස්සේ මරණයේ භීතියට පත් කළේය. මාස ගණන් තිස්සේ වසා දැමුණු රටේ ආර්ථිකය පිරිහිණි. එහෙත් ත්‍රිවිධ හමුදාව, සෞඛ්‍ය අංශ සහ රාජ්‍ය සේවය මෙන්ම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ සියලු දෙනාගේ සහාය ඇතිව වසංගතයෙන් මිය යෑමට නියමිතව තිබූ ලක්ෂ සංඛ්‍යාත වැසියන්ගේ ජීවිත බේරා ගැනීමට අප සමත් විය. එම අති දුෂ්කර කාල සීමාව තුළ පවා සියලු රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවා, අසරණ වැසියන්ට සහනාධාර දී, සියලු වැසියන් එන්නත් කර පසුගිය ආණ්ඩුව විසින් ගත් ණය සඳහා වාරිකද ගෙවීමට අප සමත් විය.

එහෙත් එයින් සිදු වුයේ ඒ වන විටත් දරුණු වී තිබූ ආර්ථික අර්බුදය වඩාත් උත්සන්න වීමය. ඇතැම් කරුණු පිළිබඳව වඩාත් යෝග්‍ය තීරණ ගත හැකිව තිබුණු බව මම පිළිගනිමි. ඒ සියලු කාරණා හේතුවෙන් පීඩාවට ලක් වූ ජනතාව පාරට බැස්සේ එම පීඩනය පිට කිරීමටය. එහෙත් ජනතාවගේ එම අරගලය ඇතැම් දෙස් විදෙස් බලවේග විසින් ප්‍රචණ්ඩත්වයට යොමු කළේ සිය පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීමටය. එම තීරණාත්මක මොහොතේ කිසිදු වැසියෙකුට හිංසාවක් නොකර අප නික්ම ගියේ තනතුරු බලයට වඩා අපගේ රාජ්‍යය අපට සිය දහස් වාරයක් වටිනා බැවිණි. එය අවිහිංසාවාදී රාජ්‍ය පාලනය පිළිබඳව ලෝකයටම කියා දුන් වටිනා පාඩමකි.

වසර 14 ක් පුරා අඛණ්ඩව ජන්දයෙන් තෝරා ගැනුණු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙසත් ඉතාම අභියෝගාත්මක දෙවසරක කාලය තුළ ඇමතිවරයෙකු ලෙසත් ලද බරපතල දේශපාලන අත්දැකීම් සමුදායක් මා හට හිමිව තිබේ. මෙවර ජනාධිපතිවරණයට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයෙන්, පොහොට්ටුවේ ලකුණින් ජනාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමේ අභියෝගය ඉතසිතින් බාර ගනු ලැබුවේ ඒ පන්නරය මතිනි. ඒ අන් කිසිවක් නිසා නොව එදා බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සහ ඩී. ඒ. රාජපක්ෂ මැතිතුමා විසින් ආරම්භ කළ මෙරට දේශීය චින්තනය මත හැදුණු වමේ දේශපාලන කඳවුරේ ජාතික ප්‍රතිපත්ති ආරක්ෂා කරමින් ඔබ වෙනුවෙන් දියුණු රටක් ගොඩනැගීමටය.

21 වන සියවසේ නව අභියෝග සඳහා තිරසාර විසඳුම්ද, නූතන තාක්ෂණික විප්ලවයද, මහින්ද චින්තනය සමග සහසම්බන්ධ කර මෙරට සංවර්ධනය නැවැත්වූ තැනින් අපි නැවත අරඹමු. වැටුණු බෝතල් කටෙන්ම අපි එළියට එමු. ඒ අභියෝගයට උර දෙන්න මා සූදානම්. මට අවශ්‍ය කරන්නේ ඔබේ ආශීර්වාදය පමණී. ඔබ වෙනුවෙන් දියුණු රටක් හදන නාමල් දැක්ම නමැති මාගේ ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ ඔබ වෙත ගෞරවයෙන් පිළිගන්වමි.

යුද්ධයෙන් බිඳී විසිරුණු රට මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් නිදහස් කර එක්සේසත් කළාක් මෙන් ආර්ථික අර්බුදයෙන් බිඳ වැටුණු රට ඉන් මුදවා සුරක්ෂිතව දියුණු කරන බවට මම ඔබට ප්‍රතිඥා දෙමි. ඒ සියලු සංවර්ධනයන් කිරීමේදී අපේ රටේ ඒකීය භාවය ආරක්ෂා කරන බවටත්, ජනරජයේ ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ආරක්ෂා කරන බවටත්, රාජ්‍ය සම්පත් ආරක්ෂා කරන බවටත්, සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරන බවටත්, සියලු වැසියන්ගේ නිදහස ආරක්ෂා කරන බවටත් මම ප්‍රතිඥා දෙමි.

ඔබ වෙනුවෙන්,



නාමල් රාජපක්ෂ

# පෙළගැස්ම


සිතගිනි නිවන කඩිනම් සහන, ඔබ වෙනුවෙන් 6
- කිසිවෙකු කුසගින්නේ නොතබන වැඩපිළිවෙලක්
- බදු බර පහළට
- සමෘද්ධි සහනය නැවතත්
- ගෙදරට එන බිලට අස්වැසිල්ලක් 7
- වැඩි සහන පොහොර ක්‍රමයක්
- වෙළඳපොළට හුස්මක්
- අලුතෙන් රැකියා ලක්ෂයක්
- බෙහෙත් ටික අතට
- අතමිට සරු තාරුණ්‍යයක් 8
- විදෙස් ආයෝජන කඩිනමින්
- ඩොලර් ගෙනෙන සංචාරක පිබිදුමක්
- රස්තියාදුවට තිත 9
- කාර්යසාධන ඇගයුම් යාන්ත්‍රණයක්

සහසබැඳි සංවර්ධන ආකෘතිය 10

1. රාජ්‍ය ප්‍රමුඛතා 11

1.1. ජාතික අත්‍යවශ්‍යතා 12
- ඒකීය රාජ්‍යයට ආරක්ෂණ සහතිකයක්
- බියෙන් හෝ සැකයෙන් තොර සමාජයක්
- නොබැඳෙන සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය
- නියෝජක ප්‍රජාතන්ත්‍රය සුරැකීම 13
- ව්‍යවස්ථාපිත අයිතිවාසිකම්
- අධිකරණයේ ගෞරවය රැකීම
- බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම 14

1.2. ආර්ථික වර්ධනයේ නව පිම්ම
- දළ දේශීය නිෂ්පාදන ඉලක්කය
- වෙළඳ ශේෂය ධන අගයකට ගෙන ඒමේ අභියෝගය
- ශක්තිමත් ඩොලර් සංචිතයක්
- රාජ්‍ය ආදායම ඉහළට - වියදම පාලනයට
- ජාතික ආපදා සංචිතයක්
- ණය ගෙවන ආර්ථිකයක් 16
- රුපියලට ස්ථාවර අගයක්
- විරැකියාවට අඛණ්ඩ විසඳුමක්
- උද්ධමනය සහ පොලී අනුපාත තනි ඉලක්කමක

1.3. සමාජ සංවර්ධනයෙන් ලොව පළමු 50 අතරට 17
- නිරෝගී සහ ආරක්ෂිත ජීවිතයක්
- අධ්‍යාපනයේ නවමු පුබුදුව
- ගෞරවාන්විත ජීවන ප්‍රමිතියක්

1.4. පාරිසරික පැවැත්ම 18
- ස්වභාවික සම්පත් සුභාවිතය
- පරිසර හානිය අවමයෙන් 19
- සතාසීපාවාටත් රැකවරණය
- සංවර්ධන සඳහා අනුමැතිය
- කාබන් ක්‍රෙඩිට් යාන්ත්‍රණය

2. නව්‍යකරණය 20

2.1. රාජ්‍ය අංශ ප්‍රශස්තකරණය 21
- ඉ-ආණ්ඩුකරණය
- රාජ්‍ය ව්‍යවසාය විකිණීමෙන් තොරව ප්‍රතිසංවිධානය
- වංචා හා දූෂණ දේශපාලනයේ අවසානය
- ණය පිළිබඳ වෝහාරික විගණනයක් 22
- රාජ්‍යයට ශේෂ පත්‍රයක්
- ප්‍රශස්ත රාජ්‍ය පරිපාලනයක්
- නොනවතින නිදහස් සෞඛ්‍ය සේවය 23
- සැමට සමානව පානීය ජලය
- අධ්‍යාපනයේ ව්‍යුහාත්මක පරිවර්තන
- මල්වන් දරුවන් 24
- මව්-අත් ගුණැති කාන්තාවන්ට මුල් තැන 25
- අධිකරණ සේවා නවීනත්වයට
- ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ ගෞරවය
- විශේෂ අවශ්‍යතා ඇති සුහුරුවන්ට 26
- සමෘද්ධියට නව අරුතක්
- විශ්‍රාමික රජයේ සේවකයන් සඳහා විශේෂ වැඩසටහනක්
- ස්වභාවික ආපදා කළමනාකරණය
- සමාජ නව්‍යකරණ තරුණ විභවය 27

2.2.කෘෂි අංශයේ පරිවර්තනය 28
- කෘෂි කර්මාන්තයට නවීකරණ යුගයක්
- සාගර ආර්ථිකයේ මහසයුරු විප්ලවය 29
- සත්ත්ව කර්මාන්ත

2.3. නිෂ්පාදන අංශයේ වටිනාකම ඉහළට 30
- උසස්-සියුම් නිෂ්පාදන කර්මාන්ත ස්ථාපනය
- බලශක්ති නිෂ්පාදන අපනයනයට
- රසායනික ද්‍රව්‍ය සහ ඖෂධ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතියෙන්
- ඛනිජ නිෂ්පාදන තිරසරව 31
- ඉදිකිරීම් ක්ෂේත්‍ර පිබිදුම

| | | |
|---|---|---|
| | ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙරළිය | 31 |
| | ඇඟලුම් නිෂ්පාදන ප්‍රසාරණය | 32 |
| | අධිවේගී මාර්ග ආශ්‍රිතව ආර්ථික කලාප | |
| 2.4. | සේවා අංශයේ නව්‍යකරණය | 33 |
| | අන්තර්ජාතික සංචාරක හුවමාරු මධ්‍යස්ථානයක් | |
| | මූල්‍ය ක්ෂේත්‍රයේ නවීකරණය | 34 |
| | සුව සේවා තෝතැන්නක් | |
| | අන්තර්ජාතික අධ්‍යාපන සේවා කේන්ද්‍රය | |
| | නිර්මාණකාරක ආර්ථිකයට හැඩයක් | 35 |
| | ලාංකේය කලාව සංස්කෘතික ලෝකයට | |
| | ගෝලීය අධ්‍යාත්මික මධ්‍යස්ථානයක් | |
| | සිල්ලර වෙළඳාමට සවිය | 35 |
| | ප්‍රවාහන සේවා නවීනත්වයට | 36 |
| | තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා | 37 |
| | ක්‍රීඩා ආර්ථිකයේ ඉදිරි පිම්ම | |
| 3. | ආයෝජනය | 38 |
| 3.1. | ව්‍යවසායකයන් සඳහා ප්‍රාග්ධනය | 39 |
| 3.2. | පොහොසත් මානව සම්පතක් | 40 |
| 3.3. | නිෂ්පාදන සඳහා පර්යේෂණ | |
| 3.4. | යටිතල සඳහා ආයෝජනය | 41 |
| 4. | නිදහස | 42 |
| 4.1. | ආර්ථික නිදහස පුළුල් කිරීම | 43 |
| 4.2. | දේශපාලනික නිදහස | 44 |
| 4.3. | සංස්කෘතික නිදහස | |
| 4.4. | ආගමික නිදහස | 45 |

# සිතගිනි නිවන කඩිනම් සහන, ඔබ වෙනුවෙන්

රටේ ආර්ථික ක්‍රියාවලිය දැනට ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධාන අනුවය. ආර්ථික අර්බුදය සමනය කිරීම සඳහා සාධනීය පියවරක් ලෙස පෙනී ගියද එය හොඳම විසඳුම නොවේ.

ආණ්ඩුවේ අයවැය පාලනය වාසිදායක වුවත් අධික බදු බර නිසා සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකය බිඳ වැටීම අවාසිදායකය. ඒ සම්බන්ධව අපේ ප්‍රතිපත්තිය නම් ශක්තිමත් ආණ්ඩුවක් යටතේ නිශ්චිත ආර්ථික සැලස්මක් සහිතව ජනතාව මත පැටවෙන බර අඩු කරන වැඩපිළිවෙළක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කටයුතු කළ යුතු බවය.

එබැවින් ආණ්ඩුවේ අයවැය ඉලක්ක සාක්ෂාත් කර ගන්නා අතරම ජනතාවට සීඝ්‍ර සහන සලසා එමගින් රටේ ආර්ථික ක්‍රියාවලිය වේගයෙන් සක්‍රීය කිරීමට කටයුතු කරනු ලැබේ.

- ## කිසිවෙකු කුසගින්නේ නොතබන වැඩපිළිවෙලක්

  සියල්ලටම ප්‍රථමයෙන් ඇත්තේ සෑම මනුෂ්‍යයෙකුගේම ආහාර අවශ්‍යතාවයයි. සියලු සංවර්ධනයන්ගේ පළමු අරමුණද එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමය. අපගේ අරමුණත් එයමය. මේ භූමිය මත වෙසෙන කිසිවෙකු කුසගින්නේ සිටිය යුතු නැත. ලොකු කුඩා සියලු දෙනාගේම තුන්වේල පිරිමැසිය හැකි කඩිනම් ආර්ථික සහනයක් ලබා දීම අපගේ පළමු ක්‍රියාන්විතයයි.

- ## බදු බර පහළට

  සියලු ජනතාව මත පටවා ඇති **එකතු කළ අගය මත බදු** (VAT) සහ **උපයන විට ගෙවීමේ බදු** (PAYE) ක්‍රමානුකූලව සංශෝධනය කරනු ලැබේ. එමගින් අඩු විය හැකි අපේක්ෂිත රාජ්‍ය ආදායම උපයා ගැනීම සඳහා රේගුව, ආදායම් බදු සහ සුරා බදු දෙපාර්තමේන්තු තුළ පවත්නා දෝෂ වහාම නිවැරදි කරනු ලැබේ.

  පොදු ජනතාව මත දැඩි පීඩනයක් ඇති වන පරිදි පනවා ඇති **අධික බදු බර අවම** කිරීම තුළින් බඩු මිළ සහ ජීවන වියදම දරා ගත හැකි මට්ටමකට පහත හෙළනු ඇත.

  තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කර බදු ගෙවීම පහසුවෙන් සහ අඩු පිරිවැයකින් කිරීම සඳහා දැනට පවත්නා ක්‍රියාවලිය කඩිනමින් වෙනස් කරනු ලැබේ.

  බදු සංශෝධනය හරහා ජනතාව අතට ලැබෙන **අමතර ආදායම** භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට යෙදවීමෙන් රටේ නිෂ්පාදනය සහ වෙළඳ ආදායම ඉහළ යනු ඇත.

- ## සමෘද්ධි සහනය නැවතත්

  ස්ථිර ආදායමක් නොමැති දෛනිකව අඩු ආදායම් උපයා ගන්නා ජනතාවට තුන්වේලටම ආහාර සපයා ගැනීමට ප්‍රමාණවත් **සහනාධාර මුදලක්** අඛණ්ඩව ලබා දීමට පියවර ගනු ලැබේ.

- ## ගෙදරට එන බිලට අස්වැසිල්ලක්

ජල සහ විදුලි වැනි උපයෝගී සේවා සඳහා දැනට මාසිකව දරන **අධික වියදමට සහනයක්** ලබා දීමට කටයුතු කරනු ලැබේ.

- ## වැඩි සහන පොහොර ක්‍රමයක්

මහින්ද චින්තන ප්‍රතිපත්ති අනුව නැවතත් වී, එළවළු පළතුරු වගාවන් සඳහා ගොවීන්ට වැඩි වාසියක් අත් වෙන **ස්ථිර පොහොර සහන ක්‍රමයක්** ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම තේ ඇතුළු අනෙකුත් වැවිලි සඳහා දැරිය හැකි සාධාරණ මිලකට පොහොර ලබා දීමෙන් රටේ කෘෂි අස්වැන්න වැඩි කිරීමට පියවර ගනු ලැබේ. එමගින් පළමු කන්න දෙක ඇතුළත අත්‍යවශ්‍ය ආහාර මිල අඩු කිරීමට හැකි වෙනු ඇත.

අතිරික්ත අස්වැන්නට අගය එකතු කර අපනයනය කිරීම සඳහා ජාත්‍යන්තර ගැනුම්කරුවන් හා සම්බන්ධීකරණයට විශේෂ ඒකකයක් පිහිටුවනු ලැබේ.

- ## වෙළඳපොළට හුස්මක්

බොහෝ සුළු, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපාර අඩපණ වීමට මූලික හේතුවක් වී ඇති ආනයන සීමා ක්‍රමානුකූලව ලිහිල් කරනු ලැබේ.

එමගින් ගෝලීය වෙළඳපොළ හා නැවත සම්බන්ධ වීමටත් සිය ව්‍යාපාර කඩිනමින් සක්‍රිය කර ගැනීමටත් ව්‍යවසායකයන්ට හැකියාව ලැබෙනු ඇත.

ආනයනික භාණ්ඩ වෙළඳාම හා සමගාමීව **දේශීය නිෂ්පාදන** ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉක්මනින් එලදාව ලැබිය හැකි ආර්ථික බෝග වගා කිරීමටත් ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන කිරීමටත් ඒවා අලෙවි කිරීම සඳහා **වෙළඳපොළ සම්බන්ධීකරණයටත්** පහසුකම් සපයනු ලැබේ.

- ## අලුතෙන් රැකියා

සෞඛ්‍ය, ඉදිකිරීම්, අධ්‍යාපන සහ පුහුණු, මෘදුකාංග ඉංජිනේරු (Software Engineering), දත්ත විශ්ලේෂණ (Data Analysis), සයිබර් ආරක්ෂණ (Cyber Security), ඉ-වෙළඳාම (e-Commerce), නිෂ්පාදන නිර්මාණක (Product Design), ඩිජිටල් නිර්මාණ අලෙවිය (Digital Content Marketing) ආදී ක්ෂේත්‍රයන්හි **දෙස් විදෙස් රැකියා අවස්ථා** රාජ්‍ය මැදිහත් වීමෙන් සම්පාදනය කිරීමට කටයුතු කරනු ලැබේ.

රැකියා සඳහා විදෙස් ගත වන්නන් දැරිය යුතු මූලික වියදම් සපයා ගැනීම සඳහා අඩු පොලියට ග්‍රාමීය, සමෘද්ධි සහ සමූපකාර බැංකු හරහා **පුද්ගල ණය ක්‍රමයක්** හඳුන්වා දෙනු ලැබේ.

- ## බෙහෙත් ටික අතට

රජයේ රෝහල් තුළ පවතින **බෙහෙත් හිඟය වහාම අවසන්** කර සෑම රෝගියෙකුටම සිය ඖෂධ සහ අනෙකුත් සෞඛ්‍ය සේවා නොපිරිහෙළා සපයනු ලැබේ.

## • අතමිට සරු තාරුණ්‍යයක්

ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවත්නා, මෙරට සිට කළ හැකි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා සඳහා තරුණ තරුණියන්ට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි **තොරතුරු තාක්ෂණ කලාප** පිහිටුවනු ලැබේ.

එම රැකියා සඳහා අත්‍යවශ්‍ය **අන්තර්ජාල පහසුකම්** මත පනවා ඇති බදු වහාම සංශෝධනය කෙරේ.

පරිගණක සහ අනෙකුත් තාක්ෂණික උපාංග මිලදී ගැනීම සඳහා පුද්ගල ඇප මත ලබා දෙන ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

## • විදෙස් ආයෝජන කඩිනමින්

මේ මොහොතේ අත්‍යවශ්‍ය විදෙස් විනිමය ලබා ගැනීම සඳහා විශේෂ ආයෝජන පහසුකම් සපයනු ලැබේ. ඒ යටතේ ඇමරිකානු ඩොලර් 250,000 ට වැඩි ආයෝජන ගෙනෙන ආයෝජකයන් සඳහා **විශේෂ වීසා ක්‍රමවේදයක්** හඳුන්වා දෙනු ලැබේ.

## • ඩොලර් ගෙනෙන සංචාරක පිබිදුමක්

ආර්ථික ස්ථායීකරණය සඳහා මේ මොහොතේ අත්‍යාවශ්‍ය විදේශ විනිමය ආදායම කඩිනමින් ඉහළ නැංවීම සඳහා සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට ප්‍රමුඛතාවය දෙමින් **විශේෂ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියක්** දියත් කරනු ලැබේ.

ඒ සඳහා අවශ්‍ය පරිදි කටුනායක සහ මත්තල ගුවන් තොටුපොළ යටිතල පහසුකම් පුළුල් කර අත්‍යාවශ්‍ය කළමනාකරණ වෙනස්කම් ඇති කරනු ලැබේ.

සංචාරකයන් බහුලව භාවිතා කරන **අඩු වියදම් ගුවන් සේවා** (Budget Airlines) සඳහා කටුනායක සහ මත්තල ගුවන් තොටුපොළ තුළ නව පහසුකම් සපයනු ලැබේ.

සංචාරක ක්ෂේත්‍ර තුළ නියැළෙන්නන්ට අවශ්‍ය ආයෝජන නොපමාව සැපයීම සඳහා අඩු පොළියක් යටතේ කඩිනම් ණය පහසුකම් සපයනු ලැබේ.

**ගෘහස්ථ සංචාරක නවාතැන්පොළ ක්‍රමය** දියුණු කිරීමට අවශ්‍ය සියලු දිරි ගැන්වීම් කරනු ලැබේ.

සංචාරක වීසා බලපත්‍රය වලංගු කාලය මාස හයක් දක්වා දීර්ඝ කරන අතර රටවල් 90 ක පුරවැසියන්ට කලින් වීසා ලබා නොගෙන පහසුවෙන් මෙරටට පැමිණීමේ අවසරය ලබා දෙනු ලැබේ.

## • රස්තියාදුවට තිත

උප්පැන්න, අධ්‍යාපන සහ වෙනත් සහතික සහ ලියකියවිලි ලබා ගැනීම සහ සහතික කර ගැනීම වැනි රාජ්‍ය සේවාවන් ලබා ගැනීමේදී සිදු වෙන අනවශ්‍ය කාලය සහ මුදල් වැයවීමට විසඳුමක් ලෙස සියලුම මහජන සේවාවන් ඒකාබද්ධ කරන **තොරතුරු තාක්ෂණ පද්ධතියක්** ස්ථාපනය කරනු ලැබේ. ඒ හරහා රස්තියාදුවකින් තොරව අදාළ කටයුතු කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

විදෙස්ගත ශ්‍රමිකයන් හට සතියක් ඇතුළත ගමන් බලපත්‍ර අලුත් කර ගැනීමට හැකි වන පරිදි අදාළ තානාපති කාර්යාල සඳහා ගමන් බලපත්‍ර මුද්‍රණ යන්ත්‍ර සහ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර ලබා දෙනු ලැබේ.

## • කාර්යසාධන ඇගයුම් යාන්ත්‍රණයක්

ඉහත දක්වන ලද කඩිනම් ආර්ථික විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේල දේශපාලන නියෝජිතයන් සහ රාජ්‍ය නිලධාරීන්ද සහසබැඳි **විශේෂ ව්‍යාපෘති බලකායක්** පිහිටුවනු ලැබේ.

# නාමල් දැක්ම

## සහසබැඳි සංවර්ධන ආකෘතිය

### රාජ්‍ය ප්‍රමුඛතා
ජාතික අත්‍යවශ්‍යතා
ආර්ථික වර්ධනය
සමාජ ප්‍රගමනය
පාරිසරික පැවැත්ම

### නව්‍යකරණය
රාජ්‍ය අංශය
කෘෂි සහ පශු අංශ
නිෂ්පාදන අංශ
සේවා අංශ



### ආයෝජනය
ව්‍යවසාය
මානව සම්පත්
නිෂ්පාදන සඳහා පර්යේෂණ
යටිතල පහසුකම්

### නිදහස
ආර්ථික නිදහස
දේශපාලනික නිදහස
ආගමික නිදහස
සංස්කෘතික නිදහස

මෙරට ක්‍රියාත්මක කළ බොහෝ සංවර්ධන සැලසුම් නිසි ලෙස සාර්ථක නොවීමට ප්‍රධාන හේතුවක් වන්නේ ඒවා අනෙකුත් අංශ සමග සහසම්බන්ධ නොවීමය. අපගේ සංවර්ධන ආකෘතිය අදාළ සියලු අංශ සහ පාර්ශවකරුවන් සහසම්බන්ධ කරන නූතන ක්‍රියාදාමයකි. එබැවින් මෙය සහසබැඳි සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබේ.

මෙම ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ සම්පාදනය කර ඇත්තේ ඉහත සහසබැඳි සංවර්ධන අරමුණු සඳහා හඳුනා ගත් නිශ්චිත සහ කාලානුරූපී ඉලක්ක සහ ඒවා සාක්ෂාත් කර ගන්නා කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන සැලසුම් මතය.

සහසබැඳි සංවර්ධන ආකෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ මතු දැක්වෙන රාජ්‍ය ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමය. ඒ සඳහා උපායමාර්ගික නව්‍යකරණ එළඹුමක් අනුගමනය කළ යුතුය. ඒ සඳහා නිශ්චිත ප්‍රතිලාභ ඉලක්ක සහිත ඒකාබද්ධ ආයෝජන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ. එමගින් පුරවැසි අයිතීන් සහතික කරන නිදහස් පරිසරයක් නිර්මාණය වනු ඇත.

# 1. රාජ්‍ය ප්‍රමුඛතා



## 1.1. ජාතික අත්‍යවශ්‍යතා

ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. එනම් ශ්‍රී ලංකාව ලෙස හඳුන්වන භූමිය සහ ඊට අයත් සියලු සම්පත් කෙරෙහි පරමාධිපත්‍යය එහි ජනතාව සතුය.

සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර්, ආදිවාසි වැදි ඇතුළු සියලුම ජාතීන්ට අයත් සෑම ශ්‍රී ලාංකික වැසියෙකුටම ශ්‍රී ලංකා ජන රාජ්‍යයේ පරමාධිපත්‍යය හෙවත් අයිතිය සහ පාලනය සමානව හිමි වේ.

ආර්ථික වේවා, සමාජයීය වේවා අපගේ සියලු සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් සිදු කළ යුත්තේ අපගේ ජාතික අත්‍යවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් බව අපගේ දැඩි විශ්වාසයයි.

- ### ඒකීය රාජ්‍යයට ආරක්ෂණ සහතිකයක්

බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කර ශ්‍රී ලංකා ජනරජයේ ඒකීය භාවය ආරක්ෂා කළේ මහින්ද චින්තන දශකය තුළය. එහෙත් තවමත් බෙදුම්වාදී දේශපාලන ව්‍යාපාරය විවිධ ස්වරූපයෙන් අපගේ රාජ්‍යයට අභියෝග කරමින් සිටී. එම අභියෝග පරදා ජනරජයේ ඒකීය භාවය අඛණ්ඩව පවත්වා ගැනීම සැමදා අපගේ ප්‍රධාන ප්‍රතිපත්තිය විය. ඒ සඳහා අවශ්‍ය සියලුම ආරක්ෂණ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබේ.

- ### බියෙන් හෝ සැකයෙන් තොර සමාජයක්

ජාතික ආරක්ෂාව මෙන්ම රාජ්‍යයේ අභ්‍යන්තර ආරක්ෂාවද තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ. මහජනයාට බියෙන් හෝ සැකයෙන් හෝ තොරව ජීවත් වීමට අවැසි පරිසරය සකස් කරන්නේ එමගිනි. ඒ සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම අපගේ ප්‍රතිපත්තියයි.

රාජ්‍ය බුද්ධි අංශ සහ ආරක්ෂක අංශ **පූර්ණ සමාලෝචනයකට** ලක් කර පවතින දෝෂ වහාම නිවැරදි කර, සුදුසු නිලධාරීන් අදාළ තනතුරු සඳහා පත් කොට රටේ පුරවැසියන් මෙන්ම විදෙස් සංචාරකයන්ගේද ආරක්ෂාව තහවුරු කෙරේ.

කිසිදු ජනවර්ගයකට, ආගමික ජන සමූහයකට හෝ දේශපාලන මතධාරීන්ට එරෙහිව ක්‍රියා කිරීමට, හිංසා කිරීමට හෝ නින්දා අපහාස කිරීමට කිසිදු ඉඩක් නොතබනු ලැබේ.

කාන්තාවන්ට සහ දරුවන්ට එරෙහිව සිදු වන සියලු ආකාරයේ හිංසන නතර කිරීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගනු ලබන අතර නීතිය අකුරටම සහ නොපමාව ක්‍රියාත්මක කරනු ඇත.

ත්‍රස්තවාදය, පාතාලය සහ **මත්ද්‍රව්‍ය පාලනය** කිරීම සඳහා කිසිදු සමාවක් නැති දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- ### නොබැඳෙන සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය

පෙර අපර දෙදිග යා කරන නාවික සහ ගුවන් මාර්ග මැද උපායමාර්ගිකව අතිශය වැදගත් ස්ථානයක පිහිටා ඇති අපගේ රාජ්‍යයට අතීතයේ සිටම බාහිර රාජ්‍යයන් විසින් විවිධ බලපෑම් එල්ල වී තිබේ. එමෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළට අප විවෘත නමුත් සාපේක්ෂව කුඩා ආර්ථිකයක හිමිකාරීත්වය මත ගෝලීය වෙළඳපොළ සිදුවීම් හරහාද අපට බලපෑම් එල්ල වේ.

එබැවින් ශ්‍රී ලංකා ජනරජයේ **ස්වාධීනත්වය රැක ගනිමින්** කිසිදු රාජ්‍යයකට හෝ කඳවුරකට හෝ නොබැඳී සියලු රටවල් සමග සමමිත්‍රත්වයෙන් සහ සුහදශීලීව කටයුතු කිරීම අපගේ විදේශ ප්‍රතිපත්තියයි.

කිසියම් බාහිර රාජ්‍යයක් විසින් අපගේ රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු කෙරෙහි කිසියම් හෝ අතපෙවීමක් සිදු කිරීමට උත්සාහ ගන්නා අවස්ථාවකදී එය වළක්වා ජනරජයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

- ## නියෝජක ප්‍රජාතන්ත්‍රය සුරැකීම

ජනරජයේ සෑම පුරවැසියෙකුටම සමානව හිමි පරමාධිපත්‍යය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ නියෝජක ප්‍රජාතන්ත්‍ර ක්‍රමය මගිනි. එනම් නිදහස් හා සාධාරණ මැතිවරණයෙන් තෝරා ගන්නා ජනතා නියෝජිතයන් විසින් ව්‍යවස්ථාදායක සහ විධායක ආයතන ක්‍රියාත්මක කිරීමෙනි.

2005 වසරට පෙර පැවති මැතිවරණ දූෂණ සහ පශ්චාත්-මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත සාහසික දේශපාලන සංස්කෘතිය අවසන් කර සියලුම පුරවැසියන්ට හිමි ප්‍රජාතාන්ත්‍රික ඡන්ද අයිතිය ස්ථාපනය කළේ මහින්ද චින්තන දශකය තුළය. එම නිදහස වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යෑම අපගේ ප්‍රතිපත්තියයි. ඒ අනුව ප්‍රමාද කර ඇති **සියලු මැතිවරණ** පළමු වසර තුළ පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රජාතාන්ත්‍රිකව තෝරා ගත් ජනාධිපතිවරයා 2022 වසරේ ප්‍රචණ්ඩත්වය යොදා ගනිමින් ඉවත් කිරීමට සංවිධානාත්මක පිරිසක් විසින් ව්‍යවස්ථා විරෝධී ලෙස උත්සාහ කිරීම ජනරජයේ ප්‍රජාතන්ත්‍රයට එල්ල වූ මරු පහරකි. අනාගත පරම්පරාවන්ට දුන් වැරදි ආදර්ශයකි. එවැනි තත්ත්වයක් නැවත සිදු නොවීමට අවශ්‍ය සියලු පියවර ගන්නා අතර සියලු වින්දිතයන්ට ගෙවිය යුතු උපරිම වන්දි මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

- ## ව්‍යවස්ථාපිත අයිතිවාසිකම්

ජනතා පරමාධිපත්‍යය පනවන සමාජ ගිවිසුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය. මානව අයිතිවාසිකම් ඇතුළු සියලු අයිතිවාසිකම් පනවන්නේද එයිනි. එබැවින් ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අප බැඳී සිටී.

එම අයිතිවාසිකම් කඩ කරන වැරදිකරුවන්ට දඬුවම් පමුණුවා වින්දිතයන්ට යුක්තිය ඉටු කර **නීතියේ ආධිපත්‍යය** ශක්තිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත.

- ## අධිකරණයේ ගෞරවය රැකීම

ජනතාව වෙනුවෙන් යුක්තිය පසිඳලන්නේ අධිකරණය විසිනි. අධිකරණයේ ස්වාධීනත්වය රැකීම අපගේ ප්‍රතිපත්තිය වේ. එබැවින් දෙස් විදෙස් බලපෑමට යටත් නොවී ජනරජයේ ගෞරවයත් අධිකරණයේ ගෞරවයත් රැකෙන පරිදි අධිකරණ කටයුතු මෙහෙයවීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## • බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම

වසර දහස් ගණනක් තිස්සේ අඛණ්ඩව පැවත ආ අපගේ ශිෂ්ටාචාරය බුද්ධ ධර්මය පදනම්ව ගොඩ නැගී තිබේ. සියලු සත්ත්වයන්ට සමානව කරුණාව දැක්වීම, දුකේදීත් සැපේදීත් උපේක්ෂාවෙන් ඉවසීම, සෑම කල්හීම සත්‍යවාදී වීම වැනි උතුම් මානුෂීය සාරධර්ම මෙන්ම දසරාජ ධර්මය වැනි රාජ්‍ය පාලන සංකල්ප පවා අපට ලැබෙන්නේ ඒ අනුවය.

එමෙන්ම සංචාරකයන් විස්මයට පත් කරවන අතීත උරුමයන් සහ ලෝකය පිළිබඳ දාර්ශනික දැනුම් පද්ධතියක් ලෙස ථෙරවාද සම්ප්‍රදාය නූතන ලෝකයටම දායාද කර තිබෙන්නේද බුද්ධ ශාසනය විසිනි.

ව්‍යවස්ථාවට මෙන්ම බෞද්ධ ප්‍රතිපදාවට අනුවද ඕනෑම වැසියෙකුට තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස අපි පිළිගන්නෙමු. එම අයිතිය ආරක්ෂා කිරීමටද බැඳී සිටින්නෙමු.

බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම උදෙසා බෞද්ධ දර්ශනය, ප්‍රාචීන භාෂා දැනුම මෙන්ම ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මානු, කොරියානු, ඉතාලි වැනි විදේශීය භාෂා දැනුම සහ තොරතුරු තාක්ෂණ දැනුමෙන්ද සාමණේර භික්ෂූන් පොහොසත් කළ යුතුය. **අනාගත ලෝකයට බුදුදහම ගෙන යාමේ නූතන යාත්‍රාව** එයයි. ඒ සඳහා භික්ෂූන් වහන්සේලා 5,000 ක් පළමුව පුහුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

සෑම ගමේ පන්සලක්ම අත්‍යවශ්‍ය පහසුකම්වලින් අංග සම්පූර්ණ කරනු ලබන අතර ශාසනය වෙනුවෙන් කැපවුණු වියපත් ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය සෞඛ්‍ය රැකවරණය සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ලබා දීමටද සැලසුම් කර ඇත. භික්ෂූන්ගේ දෙමව්පියන්ගේ රැකවරණය සඳහාද විශේෂ වැඩපිළිවෙළක් සකස් කෙරේ.

ත්‍රිපිටක ධර්මයට එල්ල වෙමින් තිබෙන උවදුරු පාලනය කර බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මය අනාගත පරම්පරාව ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.



## 1.2. ආර්ථික වර්ධනයේ නව පිම්ම

රටේ දිගුකාලීන ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය ඇති කිරීම සඳහා ඊළඟ දශකය ඇතුළත අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිපත්තිමය ආර්ථික වර්ධන ඉලක්ක පහතින් දැක්වේ.

### • දළ දේශීය නිෂ්පාදන ඉලක්කය

ඉදිරි දශකය තුළ අපගේ ඉලක්කය **ඇමරිකානු ඩොලර් බිලියන 180 ක් ඉක්මවන දළ දේශීය නිෂ්පාදනයකි.** ඒ අනුව 2035 වන විට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇමරිකානු **ඩොලර් 8,000 සීමාව** පසු කරනු ඇත.

ඉදිරි වසර 10 තුළ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි සහ පශු කර්මාන්ත අංශයේ දායකත්වය 10% ටත්, නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 25% ටත්, සේවා අංශයේ දායකත්වය 65% ටත් පවත්වා ගැනීමට කටයුතු කෙරේ.

### • වෙළඳ ශේෂය ධන අගයකට ගෙන ඒමේ අභියෝගය

අපනයන ආදායම සහ ආනයන වියදම අතර වෙළඳ ශේෂය 1977 න් පසුව මෙරට කිසිදු ආණ්ඩුවක් යටතේ ධන අගයක් ගෙන නොමැත. ඊළඟ දශකය ඇතුළත එය ධන අගයකට ගෙන ඒම අපගේ අභියෝගාත්මක ඉලක්කයයි.

### • ශක්තිමත් ඩොලර් සංචිතයක්

කෝවිඩ් වසංගතය පැවති දෙවසර තුළ සංචාරක සහ ප්‍රේෂණ ආදායම අහිමි වීමෙන් විදේශ සංචිත හිඟ විය. ස්ථාවර ආර්ථිකයක් පවත්වා ගැනීම සඳහාත්, අනාගතයේ එල්ල විය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහාත් මාස හයකට වඩා වැඩි ආනයන සඳහා ප්‍රමාණවත් ඩොලර් සංචිතයක් අඛණ්ඩව පවත්වා ගනු ලැබේ.

### • රාජ්‍ය ආදායම ඉහළට - වියදම පාලනයට

රජයේ ආදායම සහ වියදම අතර වාර්ෂික හිඟය පියවා ගැනීම සඳහා මූල්‍ය විනයක් පවත්වා ගැනීමත්, නාස්තිය අවම කර විනිවිද භාවයෙන් යුතුව වසර මුල **සම්මත කළ අයවැය නොඉක්මවා** කළමනාකරණය කිරීමත් අපගේ ප්‍රතිපත්ති වේ.

රාජ්‍ය ආදායම් ඉලක්ක සාක්ෂාත් කර ගන්නා අතර පාරිභෝගික භාණ්ඩ මත පනවන වක්‍ර බදු සහ වැටුප් මත පනවන බදු ක්‍රමානුකූලව සංශෝධනය කර ජනතාවට සහන සලසනු ලැබේ.

ආදායම් බදු ගෙවන පුද්ගලයන් සහ ව්‍යාපාර සංඛ්‍යාව වැඩි කරන අතර, දැනට පවතින විවිධ බදු වර්ග සංඛ්‍යාව අඩු කර **සරල බදු ක්‍රමයක්** හඳුන්වා දෙනු ලැබේ.

වැය කරන සෑම රුපියලකින්ම උපරිම ඵලදායිතාවයක් ලබා ගත හැකි ආකාරයට විනිවිද භාවයෙන් යුතුව රාජ්‍ය වියදම් කාර්යක්ෂම කරනු ලැබේ.

### • ජාතික ආපදා සංචිතයක්

ජාතික ආපදා අවස්ථාවකදී එම තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා ස්ථිර රුපියල් ඉතුරුම් සංචිතයක් ගොඩනගනු ලැබේ. ඒ සඳහා වාර්ෂික ආදායමෙන් නිශ්චිත ප්‍රතිශතයක් වෙන් කරනු ඇත.

## • ණය ගෙවන ආර්ථිකයක්

හැකි ඉක්මනින් සියලු ආකාරයේ ණය ආපසු ගෙවීමට හැකි ආර්ථිකයක් ගොඩනැගීමෙන් **රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් 80% දක්වා ක්‍රමිකව අඩු කිරීම අපගේ ප්‍රතිපත්තිමය ඉලක්කයයි.**

අප වැනි කුඩා ආර්ථිකයක් හිමි රටකට ජනතාව අපේක්ෂා කරන සංවර්ධනය සඳහා අවශ්‍ය පරිදි සැලසුම් සහගතව ණය ගැනීමට සිදු වේ. එම මුදල් යොදවා සිදු කරන සංවර්ධන මගින් ලාභ සහ ප්‍රතිලාභ උපයා ගැනීමට අප සමත් විය යුතුය. මහින්ද චින්තන දශකයේ සිදු කළ එවැනි සංවර්ධන තුළින් දැනටමත් විශාල ලාභ සහ ප්‍රතිලාභ ජනතාවට හිමිව තිබේ. ඒවා අඛණ්ඩව වර්ධනය කර වඩාත් ඵලදායී අන්දමින් වැඩි වැඩියෙන් ප්‍රතිලාභ උපයා දීම අපගේ ප්‍රතිපත්තිය වේ.

## • රුපියලට ස්ථාවර අගයක්

දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය, වෙළඳ ශේෂය සහ අයවැය හිඟය කළමනාකරණය තුළින් ඩොලරයට සාපේක්ෂව රුපියල ස්ථාවර අගයක පවත්වා ගැනීම අපගේ ප්‍රතිපත්තියයි.

## • විරැකියාවට අඛණ්ඩ විසඳුමක්

ආර්ථික අර්බුදයට තිරසාර විසඳුම වන්නේ මෙරට ශ්‍රම බලකායට ඉහළ වැටුප් ගෙවන රැ කියා අවස්ථා ලබා දීමය. ඉතිහාසයේ අඩුම විරැකියා ප්‍රතිශතය වන 4% වාර්තා වූයේ මහින්ද චින්තන දශකය තුළය. රැකියා අවස්ථා උත්පාදනය සහ ඒ සඳහා ශ්‍රම බලකාය පුහුණු කිරීම ඊළඟ දශකයේ අපගේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තියකි.

**සෞඛ්‍ය, ඉදිකිරීම්, අධ්‍යාපන සහ පුහුණු, මෘදුකාංග ඉංජිනේරු** (Software Engineering), **දත්ත විශ්ලේෂණ** (Data Analysis), **සයිබර් ආරක්ෂණ** (Cyber Security), **ඉ-වෙළඳාම** (e-Commerce), **නිෂ්පාදන නිර්මාණක** (Product Design), **ඩිජිටල් නිර්මාණ අලෙවිය** (Digital Content Marketing) වැනි ඊළඟ දශකයේ ඉහළ ඉල්ලුමක් ඇති වන ක්ෂේත්‍ර ඉලක්ක කර රැකියා උත්පාදනය කිරීමටත්, රැකියා උත්පාදනය කරන ව්‍යාපාර සහ එම රැකියා සඳහා පුහුණු කරන ආයතන සඳහා බදු සහන සහ ආයෝජන පහසුකම් ලබා දීමටත් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ශ්‍රම බලකායෙන් රැකියා විරහිත පුද්ගලයන් 2% ට වඩා අඩු කරනු ලැබේ. ඌන නියුක්තිකයන්ගේ ප්‍රතිශතය පහළ තනි ඉලක්කමෙන් ඉහළට යාමට ඉඩ නොතබනු ලැබේ. සියලු උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබා දීමට හැකි වන පරිදි කටයුතු කෙරේ.

ප්‍රේෂණ ආදායම වැඩි කිරීමටත්, ලාංකික ශ්‍රමිකයන්ට ගෝලීය වෙළඳපොළ අත්දැකීම ලබා දීමටත්, ඔවුන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. තවද ලාංකික ශ්‍රමිකයන්ට විදෙස් රැකියා ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය ජාත්‍යන්තරව පිළිගන්නා **නිපුණතා සහතිකකරණය** සඳහා කටයුතු කරනු ලැබේ.

## • උද්ධමනය සහ පොලී අනුපාත තනි ඉලක්කමක

**ආර්ථික වර්ධන වේගයේ සාමාන්‍යය 7% කට ආසන්න** මට්ටමේ පවත්වා ගෙන යන අතර ජීවන වියදම වැඩි වීම අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ. අයවැය හිඟය කළමනාකරණය තුළින් සහ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය මගින් පොලී අනුපාත තනි අගයක පවත්වා ගැනීම අපගේ ප්‍රතිපත්තිමය ඉලක්කයයි.

# 1.3. සමාජ සංවර්ධනයෙන් ලොව පළමු 50 අතරට

රාජ්‍යයක සමාජ සංවර්ධනය මැනිය හැකි ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදය වන්නේ එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන දර්ශකයයි (Human Development Index). ඒ සඳහා යොදා ගන්නේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ජීවන ප්‍රමිතිය පිළිබඳ මූලික දර්ශකයන්ය. ශ්‍රී ලංකාව සමාජ සංවර්ධනය අතින් අතීතයේ සිටම ඉදිරියෙන් සිටියේ අප විසින් අනුගමනය කළ නිදහස් සෞඛ්‍යය, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සමාජ සුරැකුම් වැඩපිළිවෙළ නිසාය.

මේ වන විට රාජ්‍යයන් 193 කින් 78 වන ස්ථානයේ පසු වෙමින් ශ්‍රී ලංකාව, ලොව ඉහළ මානව සංවර්ධන කාණ්ඩයට අයත්ව ඇත්තේ එම නිසාය. එහිද ඉහළම වර්ධනයක් සිදු වූයේ මහින්ද චින්තන දශකය තුළය. ඊළඟ දශකය තුළ **ඉතා ඉහළ කාණ්ඩයට** ඇතුළත් වී පළමු රටවල් 50 අතරට ඒම අපගේ ප්‍රතිපත්තිය වන අතර ඒ සඳහා අප විසින් සකස් කර ඇති ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ පහත දැක්වේ.

- ## නිරෝගී සහ ආරක්ෂිත ජීවිතයක්

ජනතාවගේ සෞඛ්‍යය පිළිබඳව ප්‍රධාන නිර්ණායකය වන **උපතේදී ආයු අපේක්ෂාව** ඉහළ අගයක් ගැනීමෙන් පෙනී යන්නේ රටක සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ එහි ප්‍රමිතිය උසස් මට්ටමක පවතින බවය. ශ්‍රී ලංකාවේ පවතින ඉහළ ආයු අපේක්ෂාවට ප්‍රධාන හේතු වන්නේ නිදහස් සෞඛ්‍ය සේවය, සමබර දිවි පැවැත්ම සහ පිරිසිදු පරිසරය යන කාරණා බැවින් ඒවා තව දුරටත් වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

ලංකාවේ අපේක්ෂිත ආයු කාලය ඊළඟ දශකය තුළ පිරිමින්ගේ වසර 74 සිට 76 දක්වාත්, කාන්තාවන්ගේ වසර 80 සිට 82 දක්වාත් ඉහළ නැංවීමට අවශ්‍ය වන ආකාරයට ඉලක්ක ගත **පොදු සෞඛ්‍ය සේවා පහසුකම්** දියුණු කිරීම අපගේ ප්‍රධාන ප්‍රතිපත්තියකි.

- ## අධ්‍යාපනයේ නවමු පුබුදුව

ජන සමාජයක සංවර්ධනය සඳහා නිසි අධ්‍යාපනයක් අත්‍යවශ්‍ය වේ. **ශිෂ්ට සම්පන්න සමාජයක්** උදෙසා අවශ්‍ය ආචාර ධාර්මික චින්තනයත්, ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණික කුසලතාවයත් ලැබෙන්නේ විධිමත් අධ්‍යාපනය සහ ප්‍රායෝගික භාවිතය මගින්ය.

එම අරමුණු ඉටු කළ හැකි ආකාරයට විෂය නිර්දේශ, ඉගැන්වීම් ක්‍රම සහ මාධ්‍ය නව්‍යකරණයට ලක් කරමින් යාවත්කාලීන කර **විධිමත් අධ්‍යාපනය** සඳහා අවස්ථා පුළුල් කිරීම අපගේ ප්‍රධාන ප්‍රතිපත්තියකි. පාසලෙන් සහ පාසලෙන් පසුව විධිමත් අධ්‍යාපනය ලැබිය හැකි සාමාන්‍ය කාලය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

- ## ගෞරවාන්විත ජීවන ප්‍රමිතියක්

සමාජ සංවර්ධනයේ තෙවන පැතිකඩ ජනතාවගේ ජීවන ප්‍රමිතියයි. එනම් පිරිසිදු සහ පෝෂ්‍යදායී ආහාරපාන, නිරෝගීකම, වාසයට සුදුසු නිවාස, අභිමානවත් රැකියා අවස්ථා, විනෝදාස්වාදය සහ ඒවායේ රක්ෂණය යන කරුණු උසස් ජීවන ප්‍රමිතියක ලක්ෂණ වේ.

ඒක පුද්ගල දළ ජාතික ආදායම වැඩි වන තරමට ජනතාවගේ ජීවන ප්‍රමිතිය උසස් වේ. එබැවින් ඊළඟ දශකය තුළ ඒක පුද්ගල දළ ජාතික ආදායම **සංවර්ධිත රටක** ප්‍රමාණයට නැංවීමට කටයුතු කරනු ලැබේ. මෙය ඉහත ආර්ථික වර්ධන ඉලක්ක සමග සහසබැඳිය.

# 1.4. පාරිසරික පැවැත්ම

ගහකොළ සිප හමන වාතය, පිරිසිදු ජලය, සරුසාර පාංශු සම්පත සහ සතාසීපාවන් ඇතුළු පරිසරය ජාතියේ හදවතය. එබැවින් දූෂණය අවම වන පරිදි පරිසරය ආරක්ෂා කර ගනිමින් ප්‍රවර්ධනය කළ යුතුය.

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට අහිතකර බලපෑම් ඇති වෙන පරිද්දෙන්ම එම බලපෑම් විසින් නැවත මිනිසාටම අහිතකර බලපෑම් එල්ල කරනු ලබයි.

කර්මාන්ත සහ ප්‍රවාහනය සඳහා අවශ්‍ය බලශක්තිය නිපදවීම සඳහා ෆොසිල ඉන්ධන දහනයෙන් නිකුත් කරන වායුන් මගින් පරිසර උෂ්ණත්වය ඉහළ ගොස් දේශගුණය දැඩි ලෙස වෙනස් වී තිබේ. අනාදිමත් කාලයක සිට ක්‍රියාත්මක වූ ස්වභාවික වැසි කාල මෙකල අක්‍රමවත් වීමට එය හේතුවකි. එයින් සාම්ප්‍රදායික ගොවිතැනට සහ ජන ජීවිතයට විශාල ගැටලු ඇති වී තිබේ.

එබැවින් ආර්ථික වර්ධනය සහ සමාජ සංවර්ධනය කළ යුත්තේ පාරිසරික පැවැත්මට අවම හානියක් වෙන ආකාරයෙන්ය. නැත්නම් අවසානයේ හදා ගත් නිවස ගංවතුරට ගසා ගෙන යන්නාක් මෙන් සියල්ල විනාශ විය හැකිය.

- ## ස්වභාවික සම්පත් සුභාවිතය

සාපේක්ෂව කුඩා භූමි ප්‍රදේශයක් සහිත ලංකාවේ ඇති ස්වභාවික සම්පත් සීමිතය. ගල් අඟුරු, බොරතෙල් හෝ ගෑස් වැනි ෆොසිල ඉන්ධන අප සතුව ඇතිදැයි තවම සොයා ගෙන නොමැත. එබැවින් ඉහත ආර්ථික සහ සමාජ ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය බලශක්තිය උත්පාදනය කිරීමට නම් අප සතුව ඇති ස්වභාවික සම්පත් වන ජලය, හිරු එළිය සහ සුළං වැඩි වැඩියෙන් භාවිතා කිරීම අපගේ ප්‍රධාන ප්‍රතිපත්තියකි. එමගින් ෆොසිල ඉන්ධන ආනයනය මත යැපීම ක්‍රමානුකූලව අඩු කිරීමට හැකි වනු ඇත.

දීර්ඝ කාලයක් තිස්සේ වගා කිරීමෙන් ඇතැම් ප්‍රදේශ තුළ පස නිසරු වෙමින් තිබේ. ඉහත ආර්ථික සහ සමාජ සංවර්ධන සඳහා අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන වැඩි කිරීම සඳහා නිරන්තරයෙන් **පස සාරවත්ව** පවත්වා ගැනීම අපගේ ප්‍රතිපත්තියයි.

මිනිස් ශරීරයට අහිතකර විෂකාරක අඩංගු කෘත්‍රිම පොහොර සහ කෘෂි රසායන භාවිතය වැළැක්වීමට ගත් පියවර බොහෝ ගොවියන් විසින් අනුමත කළේ නැත. තවද ආර්ථික වර්ධන ඉලක්ක සඳහා කෘෂි නිෂ්පාදන වැඩි කරන බව අප ඉහතින් ප්‍රකාශ කර තිබේ. එබැවින් කෘත්‍රිම රසායන භාවිතය වැළැක්වීමට දැනට නොහැකි වනු ඇත.

මැණික්, ග්‍රැෆයිට්, ක්වෝට්ස්, ඛනිජ වැලි, හුණුගල්, ෆොස්ෆේට්, මුහුදු වැලි ආදී භූගත ඛනිජ සම්පත් වේගයෙන් ක්ෂය වීමේ අවදානමක් තිබේ. එබැවින් එම සම්පත් දීර්ඝ කාලයක් පවත්වා ගත හැකි ආකාරයට වඩාත් විධිමත්ව සහ පරිසර හිතකාමීව පතල් කර්මාන්ත සිදු කිරීමට පියවර ගනු ලැබේ.

ලංකාවේ පොළොව මතුපිට පවතින වටිනාම ස්වභාවික සම්පතක් වන්නේ **අපගේ වනාන්තරය**. ජනතාවගේ ඉහළ සෞඛ්‍ය තත්ත්වයට එක හේතුවක් වන්නේ එම වනාන්තර විසින් අප හුස්ම ගන්නා වාතය පිරිසිදු කිරීමය. ආර්ථික වර්ධනය වෙනුවෙන් තව දුරටත් වනාන්තර එළි නොකර දැනට භාවිතා කරන ඉඩම් වඩාත් කාර්යක්ෂමව යොදා ගැනීම අපගේ ප්‍රතිපත්තියයි.

## • පරිසර හානිය අවමයෙන්

ආර්ථික වර්ධන ඉලක්ක තුළ කාර්මික නිෂ්පාදන වැඩි කරන බව අප ඉහතින් ප්‍රකාශ කර ඇත. එමගින් කාර්මික අපද්‍රව්‍ය නිපදවීම වැඩි වී පරිසරය වැඩි වැඩියෙන් දූෂණය වේ.

එබැවින් කර්මාන්ත මගින් පිට කරන ඝන, ද්‍රව සහ වායු අපද්‍රව්‍ය හැකි තරම් අවම කළ හැකි නව්‍යකරණයන් වෙත ආයෝජන ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය හේතුවෙන් ගංගා ඇලදොළ වැව් අමුණු මෙන්ම රට වටා පිහිටි සාගරයද දැඩි ලෙස දූෂණය වී තිබේ. එමගින් එම ජලය මිනිස් පරිභෝජනයට පමණක් නොව සාගර සතුන්ටද නුසුදුසු වී තිබේ. එයින් සංචාරක ආකර්ෂණය නැති වී ආර්ථිකයටද අහිතකර බලපෑම් එල්ල වේ.

එබැවින් ප්ලාස්ටික් සඳහා **පරිසර හිතකාමී ආදේශක** නිෂ්පාදනයටත්, අපද්‍රව්‍ය විධිමත් ආකාරයට බැහැර කිරීමටත්, ඒවා ප්‍රතිචක්‍රීකරණයටත් හැකි නව්‍යකරණ ව්‍යවසාය සඳහා ආයෝජනය කරනු ලැබේ.

## • සතාසීපාවාටත් රැකවරණය

සතාසීපාවෝද අප ජීවත් වන මහපොළොවේම අයිතිකාරයෝය. එබැවින් ස්වභාවික පරිසරයට ඔවුන්ට ඇති අයිතිය අපි පිළිගන්නෙමු. එම අයිතිය සහතික කරන්නෙමු. ඒ අනුව වඳ වීමේ තර්ජනයට ලක්ව සිටින සතුන් ආරක්ෂා කර ගැනීම අපගේ ප්‍රතිපත්තියයි.

වන සතුන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ආකර්ෂණයකි. එබැවින් එම සතුන් ජීවත් වෙන ස්වභාවික පරිසරය මෙන්ම එම සතුන්ගේ ජීවන පැවැත්මටද හානි නොවන ආකාරටයට පරිසර කළමනාකරණයද සිදු කළ යුතුය.

වන සතුන්ගෙන් වගා හානි සිදු වෙන නිසා සතුන්ගේ ජීවිත අවදානමට ලක් කිරීම වෙනුවට මෙම ගැටලුව විසඳිය හැකි නව්‍යකරණයන් සඳහා ආයෝජනය කරනු ලැබේ.

නිදැල්ලේ ජීවත් වෙන සතුන්, අත්හැර දමන සතුන් හා ආබාධයට ලක් වූ සතුන් ආරක්ෂා කිරීම සඳහා සත්ත්ව හිංසා විරෝධී සංවිධාන සහසම්බන්ධ ඒකාබද්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ.

## • සංවර්ධන සඳහා අනුමැතිය


ජනතාව අපේක්ෂා කරන ආර්ථික වර්ධනය සඳහා ආයෝජන ව්‍යාපෘති රට තුළ ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා බොහෝ විට බාධාවක් වන්නේ පරිසර වාර්තා සහ අනුමැතිය සඳහා ගත වෙන කාලය සහ වියදමයි.

එබැවින් ආයෝජකයන් විසින් ප්‍රායෝගිකව සපුරාලිය හැකි පරිසර ප්‍රමිති නිර්දේශ කල් ඇතුව ලබා දී, කඩිනමින් පරීක්ෂා කර අනුමැතිය ලබා දිය හැකි ආකාරයට අදාළ රාජ්‍ය සේවා නව්‍යකරණය කරනු ලැබේ.

## • කාබන් ක්‍රෙඩිට් යාන්ත්‍රණය

වෙනත් ඇතැම් රටවලට සාපේක්ෂව ලංකාවේ වනාන්තර ආරක්ෂා කිරීම සහ අවම පරිසර දූෂණය වෙනුවෙන් නිශ්චිත ප්‍රතිලාභයක් එම රටවලින් ලබා ගැනීමේ ක්‍රමවේදයක් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

# 2. නව්‍යකරණය



## 2.1. රාජ්‍ය අංශ ප්‍රශස්තකරණය

සහසබැඳි සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සේවය ඇතුළු සමස්ත රාජ්‍ය පාලනය ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ උසස් ක්‍රමවේදයන්ට අනුගත කොට 21 වන සියවසට ගැලපෙන ආකාරයට නව්‍යකරණය කරනු ලැබේ.

- ### ඉ-ආණ්ඩුකරණය

එකිනෙකට සහසම්බන්ධ විවිධ අංශ ගණනාවක් ක්‍රියාත්මක කිරීම සඳහා පහසු සහ වේගවත් ක්‍රමය වන්නේ ඉලෙක්ට්‍රොනික් පද්ධති මත ඒවා ස්ථාපනය කිරීමයි. එමගින් ඩිජිටල් ක්‍රමයට රාජ්‍ය ආයතන එකිනෙක අතර **තත්කාලීන තොරතුරු හුවමාරුව** සඳහා පහසුකම් සැපයෙනු ඇත.

ඒ සඳහා අවශ්‍ය **නවීන සහ දූෂ්‍ය කළ නොහැකි ජාත්‍යන්තර ප්‍රමිතියේ ආරක්ෂිත මෘදුකාංග** ස්ථාපනය කර සමස්ත රාජ්‍ය සේවා සැපයුම් ජාලය ආවරණය වන පරිදි දියුණු කරනු ලැබේ.

ජීව දත්ත ඇතුළත් **ඉලෙක්ට්‍රොනික් ජාතික හැඳුනුම්පත්** ක්‍රමය ස්ථාපනය කර අදාළ පුද්ගලයාගේ තොරතුරු එක් එක් ආයතන වෙත නැවත නැවත ලබා දීමට අවශ්‍ය නොවන පරිදි රාජ්‍ය සේවා පහසු සහ වේගවත් කරනු ලැබේ.

එමගින් සෑම කාර්යයක් සඳහාම ඈත ප්‍රදේශවල සිට කොළඹට පැමිණීමෙන් ජනතාවට සිදු වෙන රස්තියාදුව, කාලය හා ධනය අපතේ යාම වළක්වා ගත හැකි වෙනු ඇත. එම සේවාවන් තම ප්‍රදේශයේදීම සපයා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇති අතර වසරක් ඇතුළත මෙම සේවාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් **නිවසේ සිටම** සපුරා ගැනීමට පහසුකම් සපයනු ලැබේ.

එමෙන්ම රාජ්‍ය සංවර්ධනය පිළිබඳව නිවැරදි සහ තත්කාලීන දත්ත සහ තොරතුරු ජනතාවට විවෘතව ලබා ගැනීමටත් හැකි වෙනු ඇත.

මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය ආකාරයට රාජ්‍ය සේවකයන් පුහුණු කර ඔවුන්ගේ සේවා කාර්යක්ෂම කරනු ලැබේ.

- ### රාජ්‍ය ව්‍යවසාය විකිණීමෙන් තොරව ප්‍රතිසංවිධානය

රාජ්‍ය ව්‍යවසාය විකිණීම අපගේ ප්‍රතිපත්තිය නොවේ. රාජ්‍යය සතු ඉඩම්, ස්වභාවික සම්පත් සහ ව්‍යවසාය නව්‍යකරණය කිරීමෙන් සහ ඒවායේ ක්‍රියාවලි **කාර්යක්ෂම** කිරීමෙන් ජනතාවටත් සේවකයන්ටත් ලාභ සහ ප්‍රතිලාභ උපයා දීම අපගේ ප්‍රතිපත්තියයි.

ඒ සඳහා නිශ්චිත ඉලක්ක සහිත ප්‍රතිසංවිධානයක් සිදු කිරීම සඳහා **ව්‍යවසායී විධායක මණ්ඩල** පත් කරනු ලැබේ.

ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සහ තාක්ෂණික සහාය සඳහා **දේශීය පුද්ගලික අංශය** සහසම්බන්ධ කර ගැනීමට පහසුකම් සපයනු ලැබේ.

- ### වංචා හා දූෂණ දේශපාලනයේ අවසානය

රාජ්‍ය පාලනයේ සහ රාජ්‍ය සේවයේ වංචා හා දූෂණ සිදු වෙන බවට ඇතැම් පිරිස් කාලයක් තිස්සේ චෝදනා කරමින් සිටී. නමුත් එම චෝදනා ඔප්පු කිරීම සඳහා කටයුතු නොකර එය දේශපාලන සටන් පාඨයක් ලෙස අවභාවිතා කරන බව පෙනේ. එයින් සැබෑ වංචා හා දූෂණ වැළැක්වීමට බාධා ඇතිවේ.

එම නිසා පුද්ගලික අංශයේ ක්‍රියාත්මක ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ප්‍රසම්පාදන පද්ධතියක්, විවෘත සහ තරගකාරී ලංසු ක්‍රමයක්, නවීන බදු පද්ධතියක් සහ විධිමත් ආයෝජන යාන්ත්‍රණයක්** පූර්ණ විනිවිද භාවයකින් යුතුව ස්ථාපිත කරනු ලැබේ. එක් එක් අංශ සඳහා යෝග්‍ය ආකාරයට එම ක්‍රමවේද සකස් කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය පනත් සංශෝධන සහ නව පනත් සම්මත කරනු ලැබේ.

යෝජිත ප්‍රාග්ධන වියදම් අනුමත කිරීමට ප්‍රථම පරීක්ෂා කර සහතික කිරීම සඳහා විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන්ද සමන්විත පාර්ලිමේන්තු කමිටුවක් පිහිටුවනු ලැබේ. එමගින් වංචාවක් හෝ දූෂණයක් හෝ සිදු වීමට පෙර වළක්වා ගත හැකි වනු ඇත.

## • ණය පිළිබඳ වෝහාරික විගණනයක්

ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශවික සංවිධාන මගින් අඩු පොලියට ගත් දිගුකාලීන සංවර්ධන ණය සහ ඉන්දියාව, ජපානය, චීනය වැනි රාජ්‍යයන්ගෙන් අඩු පොලියට ගත් ද්විපාර්ශවික ණය මුදල් යොදවා මෙතෙක් සිදු කළ සියලු භෞතික සහ මානව සංවර්ධන පිළිබඳ වෝහාරික විගණනයක් සිදු කර එම වාර්තාව ජනතාව අතට පත් කරනු ලැබේ.

එමෙන්ම වැඩි පොලියට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හරහා ලබා ගත් ණය මුදල් භාවිත කළ ආකාරය පිළිබඳව වෝහාරික විගණනයක් සිදු කර එම වාර්තාවත් ජනතාව අතට පත් කරනු ලැබේ.

## • රාජ්‍යයට ශේෂ පත්‍රයක්

මහජන මුදල්, ණය, ආධාර සහ ඍජු ආයෝජන සහ ඒවා භාවිතා කර ඉදි කළ භෞතික සහ මානව සම්පත් සහ ඒවායේ වටිනාකම නිවැරදිව තක්සේරු කර සමස්ත රාජ්‍යය සඳහා ශේෂ පත්‍රයක් යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එමගින් රාජ්‍යය සතු සම්පත් සහ වගකීම් පිළිබඳව නිවැරදි අවබෝධයක් ජනතාවට ලබා ගත හැකිය.

## • ප්‍රශස්ත රාජ්‍ය පරිපාලනයක්

රාජ්‍යයක සාර්ථකත්වය රඳා පවතින මූලික අංශයක් වන රාජ්‍ය පරිපාලන සේවය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නව්‍යකරණය කරනු ලැබේ.

ඒ සඳහා ජනතාවගේත්, සේවකයන්ගේත්, දේශපාලන අධිකාරියේත් සහසබැඳි ප්‍රතිචාර මත පදනම් වූ **මහජන සේවා කාර්යසාධන කළමනාකරණ පද්ධතියක්** (Public Service Performance Management System) ස්ථාපිත කරනු ලැබේ.

එමෙන්ම අමාත්‍යංශ ලේකම්වරුන්ගේ සිට සංවර්ධන නිලධාරීන් දක්වා සියළු නිලධාරීන් අඛණ්ඩව පුහුණු කරමින් නවීන තාක්ෂණය සමග මුසුව ජනතාවට ගුණාත්මක සේවා සැපයීමට පහසුකම් සපයනු ලැබේ.

මෙම ප්‍රතිපත්ති දීර්ඝ කාලයක් නොවෙනස්ව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අවශ්‍ය රාජ්‍ය ආයතන සඳහා **ස්ථිර ලේකම්වරුන්** පත් කරනු ලැබේ.

## • නොනවතින නිදහස් සෞඛ්‍ය සේවය

ගුණාත්මක භාවයෙන් ඉහළ සෞඛ්‍ය සේවාවක් වඩාත් පහසුවෙන් ලබා දීම සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් සියළු රජයේ රෝහල් සහසම්බන්ධ කරමින් ස්ථාපනය කරනු ලැබේ.

ඒ හරහා **රෝගීන්ගේ පරීක්ෂණ වාර්තා සහ ඖෂධ වට්ටෝරු** ආදී තොරතුරු විධිමත්ව සහ ආරක්ෂිතව ගොනු කර ඕනෑම අවස්ථාවක ලබා ගත හැකි පරිදි ඉලෙක්ට්‍රොනික් ජාතික හැඳුනුම්පත සමග යා කෙරේ.

එමගින් නිතර රෝහල වෙත පැමිණීමෙන් ඇති වෙන පෝලිම් සහ රස්තියාදුව වළක්වා ගත හැකි වනු ඇත.

**ක්‍රියාශීලී ජනතාවක්** වැඩසටහන යටතේ පාසල් විශ්ව විද්‍යාල සහ අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවකයන්ගේද ශාරීරික යෝග්‍යතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රීඩා ප්‍රවර්ධනය කරනු ලැබේ.

ඖෂධ නිෂ්පාදනය, මිලදී ගැනීම සහ බෙදා හැරීම **පූර්ණ පරිවර්තනයකට** ලක් කර, වංචා, දූෂණ සහ නාස්තිය අවම කර ජනතාවට දැරිය හැකි මිලකට ඖෂධ සපයනු ලැබේ.

පුද්ගලික රෝහල් සේවය මගින් රජයේ සෞඛ්‍ය සේවයට ඇති පීඩනය තරමක් අඩු වේ. එබැවින් එම සේවයට සරිලන ආකාරයට සෞඛ්‍ය සේවා සඳහා බදු සංශෝධනය කරනු ලැබේ.

තරගකාරී ජීවන රටාව තුළ ආතතිය වැනි මානසික රෝග ඇති වීමේ ප්‍රවණතාවය වැඩි වේග එබැවින් රැකියාව සහ ජීවිතය අතර සමබරතාවයක් ඇති කිරීම සඳහා මානසික සෞඛ්‍ය සේවා සහ විනෝදාංශ පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

## • සැමට සමානව පානීය ජලය

සෑම පුද්ගලයෙකුටම පිරිසිදු පානීය ජලය සඳහා ඇත්තේ සමාන අයිතිවාසිකමකි. ශ්‍රී ලංකාව දැනටමත් පානීය ජල සැපයුමෙන් විශාල ප්‍රගතියක් ලබා ඇති නමුත් ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ ඕනෑම ප්‍රදේශයක ජීවත් වෙන සෑම පුද්ගලයෙකුගේම පානීය ජල අවශ්‍යතාවය අඛණ්ඩව සපුරාලීම සඳහා පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

## • අධ්‍යාපනයේ ව්‍යුහාත්මක පරිවර්තන

විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, ගණිතය, මව්බස, ආගම, කලාව සහ ව්‍යවසායකත්වය යන විෂයන් මගින් සමබර පුරවැසියෙකු නිර්මාණය කිරීම අපගේ අපේක්ෂාවය.

ප්‍රාථමික, ද්විතියික, තෘතියික යන සියලු අංශවල සියලු **අධ්‍යාපන විෂය නිර්දේශ** ඉදිර වසර තුළ සමාලෝචනයකට ලක් කර නූතන සහ අනාගත ලෝකයේ වෙළඳපොළ සහ සමාජ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට සංස්කරණය කරනු ලැබේ. මෙම සියලු කටයුතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අඩු වියදමකින් වේගවත්ව සිදු කරනු ලැබේ.

කෘත්‍රිම බුද්ධියද භාවිතා කරන සුහුරු අධ්‍යාපනයක් පාසලේ සිට විශ්ව විද්‍යාලය දක්වා හඳුන්වා දෙනු ලැබේ.

සියලුම පාසල් ගුරුවරුන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ වෘත්තීය උපදේශකරුවන් සඳහා **අඛණ්ඩව වෘත්තීය පුහුණුව** (Continuous Professional Training) ලබා දෙනු ඇත. ඔවුන්ගේ කාර්යසාධනය කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දෙන අතර ඉන් ලබා ගන්නා ප්‍රගතිය මත වැටුපට අමතර විශේෂ දීමනාවක් ලබා දෙනු ඇත.

රජයේ සහ පුද්ගලික දෙඅංශයේම **පාසල් ජාත්‍යන්තර ප්‍රමිතිකරණයට** ලක් කරනු ලැබේ.

එසේම ලෝකයේ ඕනෑම රටක රැකියාවක නිරත විය හැකි පරිදි මෙරට වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රය ජාත්‍යන්තර මට්ටමට ඔසවා තබනු ලැබේ.

එමෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම් අතර ඉහළට ගෙන ඒම සඳහා විශ්ව විද්‍යාල සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන අතර රැකියා විරහිත උපාධිධාරීන් නැවත බිහි නොකිරීම සඳහා එම විශ්වවිද්‍යාල පාඨමාලාවන් ජාත්‍යන්තර රැකියා වෙළඳපොලට ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ.

සියලු උපාධි පාඨමාලාවන්හි ප්‍රමිතිය රැකිම සඳහා උපාධි ප්‍රදානය කරනු ලබන රාජ්‍ය සහ රාජ්‍ය-නොවන විශ්ව විද්‍යාල හා උපාධි ආයතන නියාමනය කිරීම සඳහා ජාතික උසස් අධ්‍යාපන කොමිසමක් ස්ථාපිත කරනු ලැබේ.

මහා පරිමාණ පුද්ගලික අමතර පංති අධ්‍යාපනය නියාමනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විශේෂ ක්‍රමවේදයක් සකස් කෙරේ.

- ## මල්වන් දරුවන්

දරුවන් යනු දැයේ අනාගත උරුමකරුවන්ය. රටක අනාගතයේ පැවැත්ම තීරණය කරන්නේ ඔවුන්ය. එබැවින් අද දවසේ අපේ අත්හළ නොහැකි වගකීම වන්නේ නිසි පෝෂණයෙන්, යහපත් මානසිකත්වයෙන්, ජයග්‍රාහී පෞරුෂයකින් සහ ගුණගරුක හැදියාවකින් යුත් දරුවන් රටට, සමාජයට දායාද කිරීමය.

ගර්භිණී මව්වරුන්ට සහ අලුත උපන් දරුවන්ට හිඟයකින් තොරව ත්‍රිපෝෂ සහ අවශ්‍ය විටමින් වර්ග ගමේ ළමා සහ මාතෘ සායනය හරහා ලබා දීමට අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කරනු ලැබේ.

අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට පෙර පාසැල් අධ්‍යාපනය සඳහා ආධාර මුදලක් සමෘද්ධිය හරහා ලබා දෙනු ලැබේ.

මව්වරුන් විදේශගත වීම, පියවරුන්ගේ බීමත්කම හෝ මතට ඇබ්බැහි වීම, දෙමව්පියන් දික්කසාද වීම හෝ වෙන්ව වාසය කිරීම නිසා දරුවන් තනි වීම, අසරණ වීම සහ අනාරක්ෂිත වීම රට තුළ නොපෙනෙන ඛේදවාචකයක් ලෙස වර්ධනය වෙමින් තිබේ. මෙවැනි දරුවන්ට අවැසි රැකවරණය සහ පහසුකම් සැපයීම සඳහා **පෝෂක මාපිය** ක්‍රමයක් (Foster Parents) හඳුන්වා දෙනු ලැබේ. එවැනි දරුවන්ට මාස්පතා අවැසි ආධාර මුදලක් ලබා දීම සඳහා රට තුළත් විදේශගතවත් ජීවත් වන පරිත්‍යාගශීලීන්ට සම්බන්ධ විය හැකිය. එම ආධාර මගින් දරුවන්ට ආහාරපාන සකසා දීම වැනි කටයුතු කර දීම සඳහා ඒ ඒ ගම්මානවල කැමැත්තෙන් ඉදිරිපත් වන සමෘද්ධි පවුල්වල මව්වරුන්ට දීමනාවක් හිමිවන කාර්ය පැවරුමක් ක්‍රියාත්මක කරනු ලැබේ.

සෑම වයස් කාණ්ඩයකම දරුවන්ට පාසල් දිවා ආහාරය හිමි වන පරිදි එම වැඩසටහන පුළුල් කෙරේ.

- ## මව්-අත් ගුණැති කාන්තාවන්ට මුල් තැන

ස්ථිර රැකියාවක නොයෙදෙන ආදායම් ඉපැයීමට කැමති සෑම කාන්තාවකටම ඒ සඳහා අවස්ථාව ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක් කරනු ලැබේ. සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත, ආහාර නිෂ්පාදන කර්මාන්ත සඳහා **ප්‍රමුඛතාව කාන්තාවන්ට** ලබා දෙනු ඇත. ගමට සමීපයේ ආරම්භ කෙරෙන නිෂ්පාදන කලාප තුළ සෘජු හා වක්‍ර ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා සමාන අවස්ථාවක් කාන්තාවන්ට පිරිනැමේ.

කිසියම් කාන්තාවක් ආපදාවකට හෝ හිංසනයකට ලක් කිරීමට උත්සහාහ කරන විට ඉන් මිදීම සඳහා සහාය ඉල්ලීමට සහ **මනෝ උපදේශනය** ලබා ගැනීමට අවශ්‍ය විටක ඇමතීම සඳහා ක්ෂණික දුරකතන ඇමතුම් අංකයක් සහ ජංගම යෙදුමක් (Mobile App) හඳුන්වා දෙනු ලැබේ.

- ## අධිකරණ සේවා නවීනත්වයට

සියලු උසාවි නවීකරණය කරන අතර අධිකරණ කටයුතු වඩාත් විධිමත්ව සිදු කිරීම සඳහා දැඩි ආරක්ෂිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පද්ධතියක් ස්ථාපනය කරනු ලැබේ. එමගින් අධිකරණ කටයුතු පමා වීම අවම කර විනිශ්චයකරුවන්ගේත් නීතිඥවරුන්ගේත් වෘත්තීය ගෞරවය රැක දෙමින් ජනතාවට පහසුවක් සැලසීමට හැකි වනු ඇත. සමථ මූල මණ්ඩල සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදි කර දෙනු ලැබේ.

- ## ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ ගෞරවය

ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක බලකායේ වගකීම සහ බැඳීම රාජ්‍යය ව්‍යවස්ථාව සහ ප්‍රජාතාන්ත්‍රික ව්‍යුහයන් ආරක්ෂා කිරීමය. අපහසුතාවයන්ට ලක් නොවී එම සේවය කිරීමට ඔවුන්ට අවශ්‍ය නායකත්වය සහ පහසුකම් සැපයීම අපගේ ප්‍රතිපත්තියයි.

ඒ සඳහා රටේ සියලුම හමුදා සහ පොලිස් ස්ථාන **නවීකරණයටත්** නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීමටත් කටයුතු කරනු ලැබේ. එමෙන්ම අප විසින් ඉදි කළ ත්‍රිවිධ හමුදා මූලස්ථානය අංග සම්පූර්ණ කරනු ලැබේ.

සෑම ගමකටම එක් පොලිස් නිලධාරිනියක් නම් කරන අතර ඒ වෙනුවෙන් පොලිස් කාන්තාවන් 10,000 ක් අලුතෙන් බඳවා ගනු ලැබේ.

මෙරට සංවර්ධනය වසර තිහක් තිස්සේ බිඳ දැමූ යුද්ධය සහ එහි ආදීනව අනාගත පරපුරට දැන ගැනීම සඳහා **කෞතුකාගාරයක්** සහ පුස්තකාලයක් පිහිටුවනු ලැබේ. දෙස් විදෙස් සංචාරකයන් හටද එය විවෘත වනු ඇත.

නවීන දැනුම සහ ජාත්‍යන්තර ප්‍රමිතියේ පුහුණුව අඛණ්ඩව ලබා දී සියලුම ආරක්ෂක අංශ තුළ කාර්යක්ෂමතාවය ඉහළ නංවනු ලැබේ.

ආහාර, නවාතැන් සහ නිල ඇඳුම් දීමනා වෙළඳපොළ අගයන් හා යාවත්කාලීන කරනු ලැබේ.

මාර්ග නීති කඩ කිරීම් පාලනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ නවීන ක්‍රමවේදයක් සහ පද්ධති ස්ථාපිත කරනු ලැබේ. වරද කළ ස්ථානයේදීම වුවත් දඩ මුදල් ගෙවීමට හැකි වන පරිදි තාක්ෂණික යෙදවුමක් හඳුන්වා දෙනු ලැබේ.

## • විශේෂ අවශ්‍යතා ඇති සුහුරුවන්ට

අපේ ජන සමාජයේ වෙසෙන විශේෂ අවශ්‍යතා ඇති සහෝදර සහෝදරියන්ට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සියලු ආකාරයේ පහසුකම්, ආදායම් උත්පාදන අවස්ථා සහ සමාන සැලකුම් ලබා දෙනු ලැබේ.

## • සමෘද්ධියට නව අරුතක්

අඩු ආදායම් ලාභී පුද්ගලයන් සඳහා මූල්‍ය සහනයක් ලබා දෙන සමෘද්ධි වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රජා සේවා සඳහා සමෘද්ධිලාභීන් සම්බන්ධ කර ගන්නා සහ ඒ වෙනුවෙන් සකස් කෙරුණු ප්‍රතිලාභ සහිත විශේෂ වැඩසටහනක් ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

සමෘද්ධි ව්‍යාපාරය ශක්තිමත් කිරීමට විශාල දායකත්වයක් දක්වන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ නොවිසඳී ඇති වැටුප් ප්‍රශ්න හා අනෙකුත් ගැටලු නොපමාව විසඳීමට කටයුතු කරනු ලැබේ.

## • විශ්‍රාමික රජයේ සේවකයන් සඳහා විශේෂ වැඩසටහනක්

ශ්‍රී ලංකාවේ ජනගහනය වේගයෙන් වයස් ගත වෙමින් තිබේ. ඉහත සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා තරුණ ශ්‍රම බලකාය මෙන්ම විශ්‍රාමික ප්‍රජාවටද ගෞරවාන්විතව සහාය දැක්වීමට හැකි ආකාරයේ සහසබැඳි වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ.

තව දුරටත් සේවයේ යෙදීමට හැකි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මාසික දීමනාවක් හිමි වන **ස්වේච්ඡා සේවා සංචිතයක්** පිහිටුවනු ලැබේ. එහි සාමාජිකයන්ගේ පදිංචිය අනුව නිතර මහජනයා ගැවසෙන රාජ්‍ය ආයතනවල මහජන සහායක සේවාවන් හෝ සමාන ප්‍රජා සේවාවන් ඉටු කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු ඇත.

රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප වර්තමාන වැටුප් තලයන්ට ගැළපෙන පරිදි ඉහළ නංවනු ලැබේ. ඔවුන්ගේ **ස්ථිර තැන්පතු** සඳහා වෙළඳපොළ සාමාන්‍ය පොළියට වඩා වැඩි පොළියක් ගෙවනු ලැබේ.

මෙම ප්‍රජාව සඳහා දැනට ලබාදෙන රක්ෂණ ඇතුළු අනෙකුත් වරප්‍රසාද ඉහළ නංවනු ලැබේ.

## • ස්වභාවික ආපදා කළමනාකරණය

ගංවතුර සහ නායයාම් මගින් සිදු වන ජීවිත සහ දේපළ හානි අවම කර ගැනීමට අත්‍යවශ්‍ය නිවැරදි පුරෝකථන සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලැබේ.

ආපදාවක් ඇති විය හැකි බවට හඳුනා ගන්නා ප්‍රදේශ වෙත ඊට අවශ්‍ය සියලු පහසුකම් කල් ඇතුව සපයනු ලැබේ.

- ## සමාජ නව්‍යකරණ තරුණ විභවය

ලංකාවේ පොදු ගැටළු සඳහා නව්‍යකරණ විසඳුම් නිර්මාණය කළ හැකි සහ එම විසඳුම් තරුණ පරම්පරාව වෙත ගෙන යාමට උනන්දුව සහ කැපවීම ඇති තරුණ තරුණියන්ගේ සමූහයක් ගොඩනගනු ලැබේ.

තරුණයන්ගේ දේශපාලන සහභාගීත්වය වැඩි කිරීම, ක්‍රියාශීලී ජනතාවක් බිහි කිරීම, පරිසර ආරක්ෂණය, සත්ත්ව අවිහිංසාව සහ ආරක්ෂාව, දියුණු ආකල්ප වර්ධනය වැනි සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ස්වේච්ඡා සමූහය විසින් සිදු කරනු ඇත.

ජාතික තලයේ සිට ගමේ නගරයේ බිම් මට්ටමේ ආර්ථික, සමාජ, පාරිසරික ගැටලු නව්‍යකාරයෙන් විසඳන එම සමූහය අන්තර්ජාතික තරුණ සංවිධාන සමග සහසම්බන්ධ කර ජාත්‍යන්තර දැනුම් සහ අත්දැකීම් ලබමින් රටට මෙහෙවරක් කිරීමට හැකි ආකාරයට පහසුකම් සපයනු ලැබේ.

තරුණ තරුණියන්ගේ සුන්දර සිහිනයක් වන සොඳුරු විවාහ මංගල උත්සවයක් සඳහා **දායක ඉතුරුම් ක්‍රමවේදයක්** හඳුන්වා දෙනු ලැබේ.

## 2.2. කෘෂි අංශයේ පරිවර්තනය

ආර්ථිකයේ ප්‍රාථමික අංශ වන කෘෂි, ධීවර, සත්ත්ව සහ වනාන්තර ආශ්‍රිත කර්මාන්ත මගින් ඉදිරි දශකය තුළ වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 18 ක නිෂ්පාදන කළ හැකි පරිදි පරිවර්තනය කරනු ලැබේ.

- ### කෘෂි කර්මාන්තයට නවීකරණ යුගයක්

වගා කළ හැකි සියලුම කුඹුරු සහ හේන් අස්වද්දනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය ජලය, බීජ සහ පොහොර සපයනු ලැබේ.

වී ඇතුළු ධාන්‍ය වර්ග සඳහා සහතික මිලක් නියම කිරීමෙන් ගොවියාගේ ආයෝජනය සුරක්ෂිත කොට ආදායම තහවුරු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රධාන වී මෝල් හිමියන් සමග වෙළඳ ගිවිසුමකට එළඹෙනු ඇත.

අස්වනු වැඩි කර ගත හැකි නූතන තාක්ෂණික ක්‍රමවේදයන් සියලු වගා ක්ෂේත්‍රයන්ට හඳුන්වාදී ඒවා භාවිතය පිළිබඳ පුහුණුව හා දැනුම ගොවීන්ට අඛණ්ඩව ලබා දෙනු ඇත.

වැඩි අස්වනු ලබා ගත හැකි බීජ නිෂ්පාදනයේ සහ සැපයීමේ සිට අස්වනු විකිණීම දක්වා සමස්ත ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා **ගොවි සමූපකාර** සවිබල ගන්වනු ලැබේ.

අතීතයේ භාවිත කළ ප්‍රධාන සහ සුළු අපනයන බෝග යන බෙදීම වර්තමානයට නොගැළපේ. ඊට හේතුව කුරුඳු, ගම්මිරිස්, කරඳමුංගු වැනි බෝග මගින් ගෙන එන විදේශ විනිමය තේ, පොල්, රබර් වැනි ප්‍රධාන අපනයන බෝග හා තරගකාරී අගයක් ගැනීමයි. එබැවින් එකී බෝගද ප්‍රධාන අපනයන බෝග ලෙස අලුතෙන් වර්ගීකරණය කරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන අපනයන බෝග සඳහා ලබා දෙන සියලු සහනාධාර සහ අනෙකුත් වරප්‍රසාද එම වගාවන්ටත් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

කන්න අනුව වෙළඳපොළ ඉල්ලුම මත එළවළු සහ පළතුරු නිෂ්පාදන කළ යුතු ප්‍රමාණ පිළිබඳව ගොවියා කල් තබා දැනුවත් කිරීමෙන් **අස්වනු අපතේ යෑම වළක්වා** ස්ථාවර මිලක් පවත්වා ගැනීමට පියවර ගනු ලැබේ.

අතිරික්ත අස්වනු කල් තියා හඳුනා ගෙන අපනයනය සඳහා සැපයුම් දාම සම්බන්ධීකරණය කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය **ශීත සහ වියළි ගබඩා පහසුකම්** වර්ධනය කරනු ලැබේ.

තේ වතු හිමියන් සහ ශ්‍රමිකයන් අතර පවතින වැටුප් සම්බන්ධ ගැටලුවට ස්ථිර විසඳුමක් සියලු පාර්ශව හා එකඟතාවයෙන් සපයනු ලැබේ.

පොල් සහ තැඹිලි අස්වනු ඊළඟ දශකය තුළ දෙගුණයකින් වැඩි කිරීම සඳහා ඉඩම් ඇතුළු පහසුකම් සපයන අතර දේශීය අවශ්‍යතාවය සපුරා ගැනීමෙන් පසු අපනයනය සඳහා කටයුතු කරනු ලැබේ. රබර් වගාව සහ නිෂ්පාදනය ස්ථාවරව පවත්වා ගෙන යනු ලැබේ.

කැපුම් මල් සහ බුලත් නිෂ්පාදනය ඊළඟ දශකය තුළ දෙගුණයකින් වැඩි කර අපනයනය සඳහා පහසුකම් සපයනු ලැබේ.

කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහාකාර සේවය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමග සහසම්බන්ධ කර පූර්ණ නවීකරණයට ලක් කිරීමෙන් එම සේවකයන්ගේ දායකත්වය උසස් කරනු ලැබේ.

දේශීය නිෂ්පාදනයට මුල් තැන දෙන අතරම ජනතාවට දැරිය හැකි සාධාරණ මිලක් පවත්වා ගැනීම සඳහා පමණක් අවශ්‍යතාවය අනුව අදාළ බෝග ආනයනය කරනු ඇත.

- ## සාගර ආර්ථිකයේ මහසයුරු විප්ලවය

2007 දී ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව නිර්ණය කර ගැනීමට ලැබීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. අපේ රටේ මුහුදු සීමාව දීර්ඝ කිරීම සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් කළ ඉල්ලීම එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගත් අතර එමගින් අපට හිමි වෙන මුහුදු බිම් ප්‍රමාණය ලංකාවේ භූමිය මෙන් විසි ගුණයකටත් වඩා වැඩි යැයි ගණනය කර තිබේ. තවමත් නිමා වී නොමැති එම කටයුත්ත නොපමාව නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

මුහුද ආශ්‍රිත ඖෂධ නිෂ්පාදන, මත්ස්‍ය සහ මුහුදු ශාක ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත දිරි ගන්වන අතර ඒ සඳහා ආයෝජන දිරිමත් කරනු ලැබේ.

කෙටි දුර ධීවර කර්මාන්තය සඳහා අපේ ධීවර ප්‍රජාවෙන් වැඩි පිරිසක් තවමත් භාවිත කරන ඔරු සහ බෝට්ටු අනාරක්ෂිතය. එබැවින් එවැනි ධීවරයින්ගේ පහසුව සඳහා සන්නිවේදන සහ ගබඩා පහසුකම් සහිත **යාත්‍රා රට තුළම නිෂ්පාදනය** කිරීම දිරි ගන්වනු ලැබේ.

අන්තර්ජාතික නාවික සහ ප්‍රවාහන රැකියා ඉලක්ක කර ජාත්‍යන්තර ප්‍රමිතියේ පුහුණු පාඨමාලා සහ නාවික ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධි සාගර විශ්ව විද්‍යාලය ඔස්සේ ලබා දීම පුළුල් කරනු ලැබේ.

මුහුදු මාර්ග සහ මාළු අයින් පිළිබඳ අධ්‍යයනය කර මත්ස්‍ය සම්පත් සහ මුහුදු මාර්ග පිළිබඳ **නව සිතියමක්** නිර්මාණය කරනු ලැබේ.

අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ මත්ස්‍ය අස්වනු අළෙවිය සම්බන්ධයෙන් මතු වෙන අභියෝග යන්ට මුහුණ දීම සඳහා නව වෙළඳපොළ සොයා ගැනීම සඳහා ඉක්මන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

උම්බලකඩ, කරවල සහ ජාඩි වැනි මාළු ආශ්‍රිත අගය එක් කිරීමේ කර්මාන්ත සංවර්ධනය සඳහා ආයෝජන ණයක් විශේෂයෙන්ම **කාන්තා ව්‍යවසායිකාවන්ට** ලබා දීමට කටයුතු කෙරේ.

රට තුළ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා රට අභ්‍යන්තර ජලාශ ආශ්‍රිතව පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

- ## සත්ත්ව කර්මාන්ත

කිරි, බිත්තර සහ මස් පිණිස සතුන් ඇති කරන මහා පරිමාණ කර්මාන්ත වඩාත් මානුෂීය ආකාරයට සිදු කිරීමට අනුබල දෙන අතර ගෙවතු ආශ්‍රිතව සතුන් ඇති කිරීම මගින් අමතර මාසික අදායමක් උපයා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

සත්ත්ව ආහාර සඳහා භාවිතා කෙරෙන බඩඉරිඟු වගාව පුළුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

## 2.3. නිෂ්පාදන අංශයේ වටිනාකම ඉහළට

ආර්ථිකයේ ද්විතියික අංශයේ නිෂ්පාදන මගින් ඊළඟ දශකය තුළ රටේ ආර්ථිකයට වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 45 ක නිෂ්පාදන වටිනාකමක් එකතු කිරීමට කටයුතු කරනු ලැබේ.

### • උසස්-සියුම් නිෂ්පාදන කර්මාන්ත ස්ථාපනය

ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට සියුම් බවින් උසස් තාක්ෂණික නිෂ්පාදන (High-Precision Technology Products Manufacturing) සඳහා විශේෂ හැකියාවක් තිබේ. මෙම හැකියාව යොදා ගනිමින් ගෝලීය වෙළඳපොළට අවශ්‍ය නවීන නිෂ්පාදන කිරීම සඳහා ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික වැඩපිළිවෙළක් අන්තර්ජාතික පාර්ශවකරුවන් සහ ආයෝජකයින් සමග ස්ථාපනය කරනු ලැබේ.

මෙම වැඩපිළිවෙළ තුළ තාක්ෂණ සහ ආයෝජන පහසුකම් සැපයීම, ගෝලීය වෙළඳපොළ ප්‍රවේශය, **අන්තර්ජාතික හවුල්කරුවන්** සමග සපයා දෙනු ලැබේ.

දැනටමත් ක්‍රියාත්මක වන විද්‍යුත් උපාංග නිෂ්පාදනය වැනි සුළු හා මධ්‍ය පරිමාණ තාක්ෂණික නිෂ්පාදන කර්මාන්ත සහසම්බන්ධ කර **නිෂ්පාදන පොකුරු** නිර්මාණය කර ඒවා සඳහා අවශ්‍ය තාක්ෂණය, ආයෝජන සහ ගෝලීය වෙළඳපොළ ප්‍රවේශය සපයා දෙනු ලැබේ.

මහා පරිමාණ තාක්ෂණික නිෂ්පාදන කර්මාන්ත ස්ථාපනය කිරීම සහ ගෝලීය වෙළඳපොළ තුළ ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය, ආයෝජනය සහ අන්තර්ජාතික වෙළඳපොළ පහසුකම් සලසන අතර මෙම සමස්ත ක්‍රියාවලිය පහසු කරවීම සඳහා නියාමක සහ නීතිමය පරිසරය සකස් කරනු ලැබේ.

ඉහත ආර්ථික ඉලක්ක සපුරා ගැනීමෙහි ලා මෙම නව නිෂ්පාදන අංශයට ප්‍රමුඛතාවය දෙනු ඇත.

### • බලශක්ති නිෂ්පාදන අපනයනයට

බලශක්ති අපනයන මධ්‍යස්ථානයක් (Energy Export Centre) බවට ශ්‍රී ලංකාව පත් කිරීම අපගේ ප්‍රධාන ප්‍රතිපත්තියකි. ජලය, හිරු එළිය, සුළං සහ **හරිත හයිඩ්‍රජන්** වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ඇසුරෙන් නිපදවන විදුලිය අසල්වැසි රටවලට අපනයනය කිරීමට අවශ්‍ය මහා පරිමාණ ආයෝජන සිදු කරනු ලැබේ.

### • රසායනික ද්‍රව්‍ය සහ ඖෂධ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතියෙන්

දේශීය සහ ආනයනික අමුද්‍රව්‍ය යොදා ගෙන සිදු කරන විවිධ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව පුළුල් කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

කලාපයේ ප්‍රධානතම ඖෂධ සහ වෙනත් සෞඛ්‍ය නිෂ්පාදන සිදු කරන මධ්‍යස්ථානයක් (Pharmaceuticals Manufacturing Centre) බවට ශ්‍රී ලංකාව පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

## • ඛනිජ නිෂ්පාදන තිරසරව

මැණික්, ග්‍රැෆයිට්, ක්වෝට්ස්, ඛනිජ වැලි, හුණුගල්, ෆොස්ෆේට්, මුහුදු වැලි ආදී භූගත ස්වභාවික සම්පත් කැනීම සහ නිස්සාරණය වඩාත් ඵලදායී සහ නවීන තාක්ෂණය ආධාරයෙන් පරිසරයට අවම හානියක් වන පරිදි සිදු කිරීමට පහසුකම් සපයනු ලැබේ.

දේශීය සහ ආනයනික ඛනිජ ද්‍රව්‍ය මත **මෙරටදීම අගය එකතු කර** ජාත්‍යන්තර වෙළඳපොළ තුළ වැඩි මිලකට විකිණීමෙන් ඊළඟ දශකය තුළ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන ආදායම දෙගුණයකින් වැඩි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## • ඉදිකිරීම් ක්ෂේත්‍ර පිබිදුම

පසුබෑමට ලක්ව ඇති ඉදිකිරීම් ක්ෂේත්‍රය වහාම සක්‍රීය කර ඊළඟ දශකය තුළ දෙගුණයකින් ඉදිකිරීම් නිෂ්පාදන කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන මත පනවා ඇති බදු ක්‍රමානුකූලව සංශෝධනය කරනු ලැබේ.

**කොළඹ වරාය නගරය**  ජාතික ප්‍රමුඛතාවයක් සේ සලකා ඒහි ඉදි කිරීම් වේගවත් කරන අතර දැනට නවතා ඇති අධිවේගී මාර්ග සහ වෙනත් මාර්ග ඉදිකිරීම් ආරම්භ කරනු ලැබේ.

වඩාත් කාර්යක්ෂම ඉදිකිරීම් ද්‍රව්‍ය සහ තාක්ෂණ සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

නිවාස, කාර්යාල සහ ව්‍යාපාරික ස්ථාන ඉදි කිරීම සඳහා ණය පොලිය අඩු කරනු ලැබේ.

## • ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙරළිය

ලංකාවේ ප්‍රධානතම නිෂ්පාදන ක්ෂේත්‍රයක් වන ආහාර සහ පාන නිෂ්පාදනය ඊළඟ දශකය තුළ 50% කින් වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. ආහාර සහ පාන නිෂ්පාදනය කරන අවිධිමත් අංශය විධිමත් ආර්ථිකය තුළට ගෙන ඒමට පහසුකම් සපයනු ලැබේ.

ලංකාවේ සාම්ප්‍රදායික ආහාරපාන නිෂ්පාදන කර්මාන්තය වර්ධනය කරන අතර වෙළඳපොළ ප්‍රසාරණය කිරීමට කටයුතු කෙරේ. නව ආහාර සහ බීම නිෂ්පාදන සඳහා පර්යේෂණ කරන්නන් දිරි ගන්වනු ලැබේ.

වී සහ වෙනත් ධාන්‍ය වර්ග ආශ්‍රිත ක්ෂණික ආහාර නිෂ්පාදන සහ එළවළු හා පළතුරු කල් තබා ගැනීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

විවිධ රසයන්ගෙන් යුත් තේ සහ **දේශීය ඖෂධීය** පාන නිෂ්පාදනය පුළුල් කරනු ලැබේ.

කුළු බඩු, තෙල් සහ වෙනත් ශාක නිස්සාරණ නිෂ්පාදන ඊළඟ දශකය තුළ දෙගුණයකින් වැඩි කිරීමට කටයුතු කරනු ලැබේ.

දේශීය සීනි නිෂ්පාදනය දෙගුණයක් කිරීමට කටයුතු කරන අතර අපනයන වෙළඳපොළට අවශ්‍ය ආකාරයට පොල් නිෂ්පාදන කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

ආහාර සහ පාන නව්‍යකරණය සඳහා අවශ්‍ය **පර්යේෂණ පහසුකම්**, තත්ත්ව පරීක්ෂණ, අනුමැති සහ සහතික ලබා ගැනීමේ ක්‍රම විධිමත් සහ වේගවත් කරනු ලැබේ.

එම නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතියට සකස් කර අපනයනය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

## • ඇඟලුම් නිෂ්පාදන ප්‍රසාරණය

ලංකාවේ ඇඟලුම් සහ රෙදි නිෂ්පාදන කර්මාන්ත සඳහා විශාල කාලයක් තිස්සේ දැවැන්ත ආයෝජනයන් සිදු කර තිබේ. එබැවින් එම අංශය වඩාත් දියුණු කර උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබේ. ඊළඟ දශකය තුළ ඇඟලුම් සහ රෙදි නිෂ්පාදනය දෙගුණයකින් වැඩි කිරීමට පහසුකම් සපයනු ලැබේ.

ඒ සඳහා ඇඟලුම් නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා පහසුකම් සපයන අතර නව ඇඟලුම් සහ ආශ්‍රිත කර්මාන්ත සඳහා ආයෝජකයන් දිරිමත් කරනු ලැබේ.

ඒ හරහා නව රැකියා බිහි කිරීමටත් රටේ විවිධ පළාත් තුළ කර්මාන්තශාලා ඉදි කිරීමටත් හැකි වනු ඇත.

එමෙන්ම ඇඟලුම් සේවක සේවිකාවන්ගේ රැකියාවේ ගුණාත්මක භාවය සහ ඔවුන්ගේ ජීවන ප්‍රමිතිය ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබේ.

දේශීය රෙදි විවීමේ කර්මාන්ත දියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

## • අධිවේගී මාර්ග ආශ්‍රිතව ආර්ථික කලාප

අධිවේගී මාර්ග සඳහා ප්‍රධාන ඇතුළුවීම් සහ පිටවීම් ආශිත ප්‍රදේශ ඉලක්ක කර නව නිෂ්පාදන කලාප ඉදි කර ආර්ථික වර්ධනය දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

# 2.4. සේවා අංශයේ නවීකරණය

ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය සඳහා ඊළඟ දශකය තුළ තෘතියික අංශයෙන් වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 117 ක නිෂ්පාදන කිරීමට කටයුතු කරනු ලැබේ.

## • අන්තර්ජාතික සංචාරක හුවමාරු මධ්‍යස්ථානයක්

ගමනාන්තයක් පමණක් නොවන, කලාපයේ **කාර්යබහුලතම** සංචාරක හුවමාරු මධ්‍යස්ථානයක් (Travel, Trade, Transit Centre) බවට ශ්‍රී ලංකාව පත් කිරීම අපගේ මූලික ප්‍රතිපත්තියකි. නිවාඩුව පිණිස පමණක් නොව, ව්‍යාපාරික ගනුදෙනු සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ආදිය සඳහා සෑම ආකාරයකම සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය නවීන පහසුකම් සහිත දියුණු තාක්ෂණික පරිසරයක් ඒ සඳහා නිර්මාණය කරනු ලැබේ.

ඊළඟ දශකය තුළ ලෝකයේ ජනප්‍රියතම සංචාරක ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා උසස් ප්‍රමිතියේ ප්‍රචාරණ සැලැස්මක් ක්‍රියාවට නංවනු ලැබේ.

යුද්ධය අවසන් කිරීමත් සමග ලංකාව විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බවට පත් විය. මහින්ද චින්තනයේ ඉලක්කය වූ වසරකට ලක්ෂ 20 ක් සංචාරකයන් පැමිණීම 2019 වන විට සාක්ෂාත් කෙරිණි. ඊළඟ දශකය තුළ එම සංඛ්‍යාව වසරකට ලක්ෂ 50 දක්වා ඉහළ නැංවීම අපගේ ප්‍රතිපත්තියයි. ඉන් අපේක්ෂා කරන්නේ සංචාරකයන්ගේ පැමිණීම ඉහළ නැංවීම මෙන්ම ඔවුන් රට තුළ ගත කරන කාලය වැඩි කිරීමත්, එම කාලය තුළ ඔවුන් වියදම් කරන ප්‍රමාණය ඉහළ නැංවීමත්ය.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදි කරනු ලැබුවේ එම අමතර සංචාරකයන්ගේ පැමිණීම සඳහා කටුනායක ගුවන් තොටුපොළ ප්‍රමාණවත් නොවන නිසාය. එබැවින් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමෙන් මත්තල ගුවන් තොටුපොළ වඩාත් දියුණු කිරීමට හැකි වෙනු ඇත. ගුවන් තොටුපොළ ඇතුළුවීමේ සිට පිටවීම දක්වා සමස්ත ක්‍රියාවලිය සඳහා නවීන **ඉලෙක්ට්‍රොනික් පද්ධතියක්** ස්ථාපිත කර පහසු සහ වේගවත් කරනු ලැබේ.

මුහුදු සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලැබේ.

සංචාරකයන් සඳහා අවශ්‍ය කාමර සහිත ලොකු කුඩා හෝටල් සහ **ගෘහාශ්‍රිත නවාතැන්** පහසුකම් ඉදි කිරීම සඳහා විශේෂ ආයෝජන සහ ණය පහසුකම් සපයනු ලැබේ.

දැනට ප්‍රසිද්ධ ගමනාන්තයන්ට අමතරව දිවයින පුරා නව සංචාරක ආකර්ෂණ ස්ථාන 10 ක් සහ නව සංචාරක අත්දැකීම් රැසක් නිර්මාණය කරන අතර ජාත්‍යන්තර සැණකෙළි සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීමට පහසුකම් සපයනු ලැබේ.

සිය ගමනාන්ත වෙත ඉක්මනින් යා හැකි වන පරිදි අන්තර්ජාතික ගුවන් ගමන් කාලසටහන් හා ගැලපෙන ආකාරයට කටුනායකල මත්තල සහ පලාලි ගුවන් තොටුපොළ සහසම්බන්ධ කරන අභ්‍යන්තර ගුවන් සේවා පුළුල් කරනු ලැබේ.

සංචාරකයන් විසින් මිලදී ගන්නා භාණ්ඩ මත අගය එකතු කළ බද්ද රටෙන් පිටව යන අවස්ථාවේ **ප්‍රතිපූර්ණය** කිරීමෙන් භාණ්ඩ මිලදී ගැනීමට අනුබල දෙනු ලැබේ.

සංචාරක මග පෙන්වන්නන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

## • මූල්‍ය ක්ෂේත්‍රයේ නවීකරණය

ආර්ථිකයෙන් 20-30% දැනට සිදු වන්නේ බැංකු පද්ධතියෙන් පිටතය. එය එම ව්‍යවසායකයන්ට මෙන්ම ගනුදෙනුකරුවන්ටද අනාරක්ෂිත වන අතර රාජ්‍ය ආර්ථිකයටද අහිතකරය. එබැවින් සමස්ත ගනුදෙනු 90% බැංකු පද්ධතිය තුළට ගෙන ඒමට අවශ්‍ය නියාමනය සහ පහසුකම් ස්ථාපනය කිරීම අපගේ ප්‍රතිපත්තියයි.

කාසි සහ නෝට්ටු භාවිතය අවම කිරීම සඳහා **බැංකු කාඩ් සහ ජංගම පසුම්බි** (Mobile Wallets) ආදිය ප්‍රවර්ධනය කරනු ලැබේ.

වංචනික මූල්‍ය ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා බුද්ධි අංශ ක්‍රියාත්මක කරනු ලැබේ. එමගින් හඳුනා ගන්නා වංචනිකයන් හට දැඩිව නීතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

සිසු ණය සහ තරුණ ව්‍යවසායකත්ව ණය පහසුකම් සැපයීම කේන්ද්‍ර කර ගෙන සමුපකාර බැංකු පද්ධතිය ශක්තිමත් කරනු ලැබේ. එමගින් **ග්‍රාමීය ව්‍යවසායකත්වය** දියුණු කිරීම සඳහා නව ආයෝජන වැඩසටහන් හඳුන්වා දෙනු ලැබේ.

## • සුව සේවා තෝතැන්නක්

ලෝකයේ ප්‍රමුඛතම සෞඛ්‍ය හා සුව සේවා පාරාදීසයක් (Health and Healing Centre) බවට ලංකාව පත් කිරීමට කටයුතු කරනු ලැබේ. ලොව දියුණුතම පෞද්ගලික රෝහල් මෙරට ඉදි කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික හවුල් ආයෝජන සිදු කරනු ලැබේ.

ලංකාවේ දැනටමත් ඉහළ මට්ටමේ පවතින පුද්ගලික සෞඛ්‍ය සේවා අංශයෙන් විදේශිකයන් හට වඩාත් විධිමත්ව සේවා සැපයීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

අනාදිමත් කාලයක සිට පැවත එන **සිංහල පාරම්පරික වෛද්‍ය ක්‍රමය** සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය නිසි අධීක්ෂණය යටතේ නිසි ප්‍රමිතියකට ලක් කර ප්‍රවර්ධනය කරනු ලැබේ.

## • අන්තර්ජාතික අධ්‍යාපන සේවා කේන්ද්‍රය

ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතින යුධමය වාතාවරණයෙන් තොර **සාමකාමී අන්තර්ජාතික අධ්‍යාපන කේන්ද්‍රයක්** (International Education Centre) බවට පත් කරමින් දියුණු අධ්‍යාපන පහසුකම් ලංකාවේ සුන්දරතම ප්‍රදේශ ආශ්‍රිතව ගොඩනගනු ලැබේ.

ලංකාවේ අර්ධ රාජ්‍ය සහ පුද්ගලික විශ්ව විද්‍යාල සඳහා ඊළඟ දශකය තුළ 10,000 කට වැඩි විදේශික සිසුන් බඳවා ගැනීමට පහසුකම් සපයනු ලැබේ.

ඒ යටතේ අධ්‍යාපනික සහ නේවාසික පහසුකම් පුළුල් කිරීම, විද්වත් හා ගුණාත්මකභාවයෙන් යුත් දෙස් විදෙස් ආචාර්යවරුන් බඳවා ගැනීම සහ විදෙස් සිසුන්ට ආරක්ෂිත වටපිටාවක් සැකසීම සඳහා කටයුතු කරනු ලැබේ.

එමගින් විදේශ විනිමය උපයා ගැනීමටත්, පිටරටට ඇදී යන විදේශ විනිමය අවම කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.

## • නිර්මාණකාරක ආර්ථිකයට හැඩයක්

විවිධ සමාජ මාධ්‍යයන් ඔස්සේ විශාල ග්‍රාහක පිරිසක් නරඹන ශ්‍රව්‍ය-දෘශ්‍ය නිර්මාණ සැදීම, එකලස් කිරීම සහ බෙදා හැරීම (Creator Economy) අද වන විට තරගකාරී ගෝලීය සේවා අංශයකි. ලංකාවේ එවැනි නිර්මාණකරුවන්ට සිය සේවා සැපයීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

## • ලාංකේය කලාව සංස්කෘතික ලෝකයට

කලාව යනු රටක සංස්කෘතිය විදහා පාන සුවිශේෂී ආකාරයකි. අපගේ ඉපැරණි සංස්කෘතික කලාවන් පෝෂණය කර නවීනත්වයෙන් යුතුව ජාත්‍යන්තර වෙළඳපොළට ගෙන යන සංස්කෘතික මධ්‍යස්ථානයක් (Cultural Export Centre) බවට ලංකාව පත් කිරීමට කටයුතු කරනු ලැබේ. නැටුම්, ගැයුම්, වැයුම් සහ රැඟුම් ඇතුළත් ලංකාවේ කලාව අන්තර්ජාතික සංස්කෘතික නිෂ්පාදනයක් ලෙස දියුණු කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

එමගින් ලාංකික කලාකරුවන්ට අන්තර්ජාතික පිළිගැනීමත්, ඔවුන්ගේ කලා නිර්මාණ වඩාත් උසස් ප්‍රමිතියෙන් යුතුව කිරීමටත් හැකියාව ලැබෙනු ඇත.

## • ගෝලීය අධ්‍යාත්මික මධ්‍යස්ථානයක්

මේ වන විට ලොව පුරා වෙසෙන මිනිසුන්ගේ ගැටලුවක් බවට පත්ව ඇත්තේ තම මානසික සුවතාව බිඳීයාමයි. ඒ නිසා ඔවුන් තම මානසික සුවය පතා ලෝකයේ විවිධ තැන්හි ඇති විවිධාකාර ක්‍රමවේදයන් සොයා යන්නට පටන් ගෙන තිබේ. විවිධ භාවනා ක්‍රම ඇතුළත් නිර්මල බුදුදහම ප්‍රමුඛ විවිධ ආසියාතික ආගමික හර පද්ධතීන් ඊට තෝතැන්නකි. එබැවින් ඒ සියලු ආගමික හරයන්ගෙන් සැදුම්ලත් ගෝලීය අධ්‍යාත්මික මධ්‍යස්ථානයක් (Spiritual Centre) බවට අපේ රට පත් කරන්නෙමු.

## • සිල්ලර වෙළඳාමට සවිය

ඉක්මනින් විකිණෙන පාරිභෝගික භාණ්ඩ (FMCG) සහ ගෘහාශ්‍රිත උපකරණ වෙළඳාම් උසස් ප්‍රමිතියෙන් යුතුව වර්ධනය කිරීම සඳහා පියවර ගනු ලැබේ. ඒ සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට නව්‍යකරණය කරනු ලැබේ.

කුඩා වෙළඳසැල් සහ ඒවායේ සැපයුම් දාම විධිමත් කිරීමෙන් **ආදායම් වැඩි කර ගැනීම** සඳහා පුහුණුවීම් හා බැඳුණු ආයෝජන පහසුකම් සලසනු ලැබේ.

ඇඳුම්, පාවහන්, විලාසිතා සහ ආභරණ වෙළඳාම් ජාත්‍යන්තර ප්‍රමිතියට දියුණු කිරීමෙන් සංචාරක පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා එම භාණ්ඩ මත පනවා ඇති ආනයන සීමා අහෝසි කර තීරුබදු සංශෝධනය කෙරේ.

ඉඩම්, නිවාස, මහල් නිවාස සහ වාහන වෙළඳාම් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය රාජ්‍ය සේවා විධිමත කර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් එම සේවා පහසු කරනු ලැබේ.

සියලුම වර්ගයේ ආපනශාලා සහ චිත්‍රපටශාලා වැනි විනෝදාස්වාදය සපයන සේවා උසස් ප්‍රමිතිකරණයට ලක් කරනු ලැබේ. කුඩා අවන්හල් විධිමත් සහ සනීපාරක්ෂක ප්‍රමිතීන් අනුව සකස් කර ගැනීම සඳහා පුහුණු කිරීම් හා බැඳුණු ආයෝජන පහසුකම් සලසනු ලැබේ.

පිටකොටුව වෙළඳපොළ, ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන සහ සතිපොළ වැනි ස්ථාන වෙළඳුන්, සේවකයන් සහ පාරිභෝගිකයන් වෙනුවෙන් ගෞරවාන්විත ප්‍රමිතියකට ගැලපෙන ආකාරයට නව්‍යකරණය කරනු ලැබේ.

**ඉලෙක්ට්‍රොනික වෙළඳාම (e-Commerce) ප්‍රවර්ධනය සඳහා පාරිභෝගික විශ්වාසය නැංවීමට අවශ්‍ය රාජ්‍ය නියාමනය සපයනු ලැබේ. එමෙන්ම පිටරටින් ගෙන්වන භාණ්ඩ සඳහා සරල බදු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.**

## • ප්‍රවාහන සේවා නවීනත්වයට

මහින්ද චින්තන දශකය තුළ සමස්ත දිවයිනම ආවරණය වෙන පරිදි ඉදි කළ අධිවේගී මාර්ග ඇතුළු මහා මාර්ග පද්ධතිය අදටත් හොඳින් පැවතීමෙන් ඔප්පු වෙන්නේ ඒවායේ ඉහළ ප්‍රමිතියයි.

නමුත් මාර්ගයට සාපේක්ෂව ප්‍රවාහන සේවය දියුණු වී නොමැත. ප්‍රවාහනය පුද්ගලික අංශයට විවෘත කර වසර 50 ක් ගත වී ඇතත් පුද්ගලික බස් රථ තවමත් නවීකරණය වී නොමැත. එමෙන්ම පුද්ගලික බස් රථ ධාවනය මගීන්ට අවදානම් ආකාරයෙන් සිදු කරනු දැකිය හැකි වන අතර ඒවා තුළ ගමන් ගන්නා මගීන්ට සුවපහසුවද ප්‍රමාණවත් නොවේ. මෙය ගෞරවාන්විත ජීවන ප්‍රමිතියට බාධාවකි.

පැරණි බස් රථ ක්‍රමානුකූලව භාවිතයෙන් ඉවත් කර ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් නවීන සහ **සුවපහසු බස් රථ** පමණක් මින් ඉදිරියට ගෙන්වීම සඳහා නව බලපත්‍ර සහ ණය පහසුකම් සපයනු ලැබේ.

අපරීක්ෂාකාරී ලෙස බස් රථ ධාවනය කරන රියදුරන්ගේ බලපත්‍ර අත්හිටුවා ඔවුන්ට නිසි උපදේශනය සහ රිය පුහුණුව ලබා දීමෙන් පසුව නව බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊළඟ දශකය තුළ **දුම්රිය සේවයේ පූර්ණ නව්‍යකරණයක්** සිදු කරනු ලැබේ. පවතින දුම්රිය මාර්ග මගින් දෙගුණයක ඵලදායිතාවයක් ලබා ගත හැකි පරිදි නව දුම්රිය යොදවන අතර දුම්රිය කාලසටහන් සහ ප්‍රවේශ පත්‍ර ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පද්ධතියක් ඔස්සේ සිදු කරනු ලැබේ.

මහා මාර්ග ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම නිසා මාර්ග තදබදය වැඩි වේ. එබැවින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය මාර්ග වැඩිපුර භාවිතා කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

අධිවේගී මාර්ගයන්ට සමාන්තරව දුම්රිය මාර්ග ඉදි කිරීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම දිවයින වටා පිහිටා තිබෙන නාවික තොටුපොළ සහසම්බන්ධ කරමින් මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා පුළුල් කරනු ලැබේ.

අන්තර්ජාතික නාවික ප්‍රවාහන ක්ෂේත්‍රයේ මධ්‍යස්ථානයක් වන ශ්‍රී ලංකාව තවදුරටත් එම අංශයෙන් දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

- ## තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා

කෘත්‍රිම බුද්ධිය (AI) තාක්ෂණයේ වේගවත් දියුණුවත් සමග තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි සැපයුම් සහ කළමනාකරණ සේවා (IT-BPM) වඩාත් ස්වයංක්‍රීය වීමෙන් එම අංශයේ සාම්ප්‍රදායික රැකියා වෙනස් වෙමින් තිබේ.

එබැවින් කෘත්‍රිම බුද්ධිය මත පදනම් වුණු නව්‍යකරණ සේවා නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ.

- ## ක්‍රීඩා ආර්ථිකයේ ඉදිරි පිම්ම


ලංකාවේ ක්‍රීඩාව ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් සේවා අංශයක් ලෙසද දියුණු කිරීමෙන් ආදායම් උපදවන තැනකට පත් කළ හැකිය.

එබැවින් විනෝද ක්‍රීඩා, තරගකාරී ක්‍රීඩා සහ ඉලෙක්ට්‍රොනික් ක්‍රීඩා ආදී අංශ සේවා ලෙස දියුණු කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

කුසලාන සහ පදක්කම් දිනිය හැකි වෘත්තීයමය සහ **විනයගරුක ක්‍රීඩකයන්** බිහි කිරීම සඳහා පාසල් මට්ටමේ සිට ජාතික තලය දක්වා බැඳුනු සාධාරණ සහ විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා දෙනු ලැබේ.

එමගින් ක්‍රියාශීලී ජනතාවක් බිහි කිරීමට මෙන්ම දේශීය ක්‍රීඩකයන්ගේ විශිෂ්ටත්වය ඉහළ නැංවීමටද හැකියාව ලැබෙනු ඇත.

# 3. ආයෝජනය



ඊළඟ දශකයේ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉහත නව්‍යකරණයන් සිදු කිරීම සඳහා ආයෝජන සිදු කළ යුතුය. ඒ සඳහා මහජන සහ පුද්ගලික සහසබැඳි ආයෝජන (Public Private Integrated Investment) සැලසුමක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ආයෝජනයක් යනු සෑම විටම වියදමක් නොවේ. අනාගතයේ ආදායම් ඉපදවිය හැකි සම්පතක් ඉදි කිරීම වෙනුවෙන් කිසියම් වියදමක් දැරීම ආයෝජනයකි. උදාහරණයක් ලෙස අධිවේගී මාර්ග ඉදි කිරීමෙන් ආදායමක් ලැබේ. එබැවින් එය ආයෝජනයකි.

ඇතැම් වියදම් ආයෝජන නොවේ. ආයතනයක එදිනෙදා කටයුතු කර ගෙන යෑම සඳහා දරන වියදමෙන් ආදායම් ඉපදිය හැකි සම්පතක් නොලැබේ.

එබැවින් ආයෝජන සහ වියදම් වෙන් කර හඳුනා ගැනීම වැදගත්ය.

## 3.1. ව්‍යවසායකයන් සඳහා ප්‍රාග්ධනය

නව්‍යකරණයන් සිදු කළ පමණින් ඒවා සාර්ථක නොවේ. වෙළඳපොළ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිදි නව්‍යකරණ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ව්‍යවසායකත්වයයි.

ඕනෑම රාජ්‍යයක ආර්ථිකය දියුණු වන්නේ ව්‍යවසායකයන් නිසාය. නමුත් ඒ සඳහා ඔවුන් අවදානමක් දැරිය යුතුය.

එබැවින් **දේශීය ව්‍යවසායකයන් දියුණු කිරීම** සඳහා ඔවුන්ට අවශ්‍ය ප්‍රාග්ධනය සහ අනෙකුත් පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ඉලක්ක ගත නිෂ්පාදන අංශ තුළ නවව්‍යවසාය (Startups) සිට මහා පරිමාණ ව්‍යවසාය දක්වා සහසබැඳි ආයෝජන වැඩසටහන් හඳුන්වා දෙනු ලැබේ.

ආයෝජන විධිමත්ව සහ පහසුවෙන් සිදු කිරීම සඳහා ව්‍යාපාරික බැංකුවලට අමතරව ව්‍යවසාය සංවර්ධන ආකෘතියට සමූපකාර බැංකු හරහා **වසරකට රුපියල් බිලියන 10 ක ආයෝජන** සිදු කරනු ලැබේ.

එමෙන්ම විදේශීය සහ දේශීය ව්‍යවසායකයන් අතර සහසම්බන්ධයෙන් ව්‍යාපාර ගොඩනැගීම සඳහා පහසුකම් සැපයේ.

පුද්ගලික හිමිකාරීත්ව (Private Equity) ප්‍රාග්ධන ආයෝජන මෙන්ම කොටස් වෙළඳපොළ හරහා ආයෝජන අවස්ථා වැඩි කිරීම සඳහා අවශ්‍ය නව පනත් සහ පහසුකම් සපයනු ලැබේ.

සමාජ සහ පාරිසරික ගැටලු නව්‍යාකාරයෙන් විසඳන සමාජ ව්‍යවසායකයන් සඳහා රුපියල් බිලියනයක **සමාජ ආයෝජන අරමුදලක්** (Impact Investing Fund) හඳුන්වා දෙනු ලැබේ. එමගින් ආණ්ඩුව විසින් දැරිය යුතු වියදම් අඩු කර ව්‍යවසායී විසඳුම් මගින් එම ගැටලු විසඳිය හැකි වෙනු ඇත.

විදේශීය ආයෝජන වැඩි කිරීම සඳහා ඇති බාධා ඉවත් කර පහසුකම් සපයනු ලැබේ. එම ආයෝජන විනිවිද භාවයකින් සහ විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සකස් කරනු ලැබේ.

දේශීය ව්‍යවසාය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළ සැපයුම් දාම සමග සම්බන්ධ කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

## 3.2. පොහොසත් මානව සම්පතක්

ඉහත සියලු සංවර්ධන සඳහා මෙරට මානව සම්පත අඛණ්ඩව දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

ලංකාවේ ජනගහන වර්ධන වේගය අඩු වීම හේතුවෙන් වයස් ගත ප්‍රජාවට සාපේක්ෂව තරුණ ප්‍රජාව සීග්‍රයෙන් අඩු වෙමින් තිබේ. ඉහත ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිෂ්පාදන පුළුල් කිරීම සඳහා මෙය බාධාවකි.

එබැවින් ජනගහන වර්ධනය නිසි පරිදි කළමනාකරණය කරන අතර එම ජනගහනය නිරෝගීව දීර්ඝ කාලයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පෝෂණ සහ සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ආයෝජනය කරනු ලැබේ.

ඉහත සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය **විශේෂඥයන්ගේ සේවය** රටට ලබා ගැනීම සඳහා දිරි දීමනා සහිත වෘත්තීය ගෞරවය ආරක්ෂා කරන විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.

මනසින් මෙන්ම කයින්ද නිරෝගී පුරවැසියන් බිහි කිරීම සඳහා පාසල් මට්ටමේ සිට ජාතික තලය දක්වා සියලුම ක්‍රීඩා ක්ෂේත්‍ර දියුණු කිරීම සඳහා ආයෝජනය කරනු ලැබේ.

වේගවත් ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය විධිමත් අධ්‍යාපනය, කුසලතා සහ ආකල්ප වර්ධනය කළ හැකි වැඩසටහන් සඳහා ආයෝජනය කරනු ලැබේ.

ගෞරවනීය ජීවන ප්‍රමිතියක් සඳහා අත්‍යවශ්‍ය ආගමික සහ සංස්කෘතික අංශ දියුණු කිරීම සඳහා ආයෝජනය කරනු ලැබේ.

**සිරගතව සිටින ශ්‍රමිකයන්** ආර්ථික ක්‍රියාවලියට වැඩිපුර දායක කර ගැනීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.

## 3.3. නිෂ්පාදන සඳහා පර්යේෂණ

සංවර්ධනය වෙනුවෙන් නව්‍යකරණය සඳහා නිරන්තරයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කළ යුතුය. එබැවින් ඉලක්ක ගත වෙළඳපොළ අංශ තුළ සාර්ථක කළ හැකි නව නිෂ්පාදන සඳහාත් දැනට සිදු කෙරෙන නිෂ්පාදන වඩාත් උසස් ප්‍රමිතියකට පත් කිරීම සඳහාත් අවශ්‍ය පර්යේෂණ සඳහා ආයෝජනය කරනු ලැබේ.

ඒ සඳහා විශ්ව විද්‍යාල සහ රජයේ පර්යේෂණ ආයතනයන්ට අමතරව පුද්ගලික අංශයේ පර්යේෂණ ආයතන සහසම්බන්ධ කරන **දියුණු පර්යේෂණ සංස්කෘතියක්** බිහි කිරීමට ආයෝජනය කරනු ලැබේ.

එම පර්යේෂණ මගින් උත්පාදනය කරන නව දැනුම සහ නිෂ්පාදන සඳහා බුද්ධිමය අයිතිය එම ආයෝජනයන්ට සාපේක්ෂව රජය වෙත ලබා ගැනීමටත් ඒ හරහා ආදායම් උපයා ගැනීමටත් හැකි වෙනු ඇත.

# 3.4. යටිතල සඳහා ආයෝජනය

අභ්‍යන්තර, කලාපීය සහ ජාත්‍යන්තර අන්තර් සම්බන්ධීකරණය සඳහා භෞතික සහ මෘදු යටිතල පහසුකම් යන දෙවර්ගයම අයත් වන යටිතල පහසුකම් ජාලය දියුණු කරනු ලැබේ.

කටුනායක, මත්තල, යාපනය, රත්මලාන සහ හිඟුරක්ගොඩ ගුවන් තොටුපොළ මෙන්ම කොළඹ, හම්බන්තොට, ගාල්ල සහ ත්‍රිකුණාමලය මුහුදු වරායන් ඉදිරි වසර 15 තුළදී වසරකට මිලියන 80 ක මගීන්ට සේවා සැපයීමට හැකි වන පරිදි සංවර්ධනය කෙරේ.

ගමනාගමන පද්ධතිය සනීපාරක්ෂක පහසුකම්ද සහිතව ජාත්‍යන්තර ප්‍රමිතියට වැඩි දියුණු කර සම්පූර්ණ කරනු ලැබේ.

**සෑම වැසියෙකුටම ආරක්ෂිත නිවාසයක්** ලබා දීමේ ප්‍රතිපත්තිය අනුව යමින් නිවාස ඉදි කිරීම් සඳහා ආයෝජනය කරනු ලැබේ.

ඉහත ආර්ථික ඉලක්ක හා බැඳුනු නගර සහ ගම් සැලසුම් කිරීම, නව නගර නිර්මාණය සහ ඉදි කිරීම, කාර්යාල සහ කර්මාන්තශාලා ඉදි කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.


ඊළඟ දශකය තුළ ඉදි කරන සියලු රාජ්‍ය ගොඩනැගිලි නූතන සහ අනාගත දේශගුණික තත්ත්වයන්ට ගැලපෙන පරිදි, **අවම නඩත්තු වියදම් සහිතව** සහ පරිසර හිතකාමී ආකාරයට නූතන තාක්ෂණික ක්‍රමයන්ට අනුකූලව සැලසුම් කර ඉදි කරනු ලැබේ.

එම සියලු ඉදි කිරීම් අතර සහසම්බන්ධය තුළින් සම්පත් සහ කාලය නාස්තිය අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉන්ධන ආනයන අඩු කිරීම සඳහාත්, පරිසර දූෂණය අවම කිරීම සඳහාත් අඛණ්ඩව විදුලිය සැපයිය හැකි වන පරිදි රටේ බලශක්ති අවශ්‍යතාවය පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් සිදු කිරීම සඳහා ආයෝජනය කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවා ජාත්‍යන්තර ප්‍රමිතියට නැංවීම සඳහා අවශ්‍ය **නූතන මෘදුකාංග** සහ ඒවා ස්ථාපනය කර ආරක්ෂිතව සහ අඛණ්ඩව ක්‍රියාත්මක කළ හැකි තාක්ෂණික දෘඪාංග සඳහා ආයෝජනය කරනු ලැබේ.

# 4. නිදහස



නිදහස යනු තමා කැමති ආකාරයට සිතීම, කතා කිරීම සහ ක්‍රියා කිරීමය. සෑම පුරවැසියෙකුටම සමාන නිදහසක් තිබේ. එබැවින් තමාගේ නිදහස භුක්ති විඳීමේදී අනෙකාගේ නිදහසට බාධාවක් නොවන අයුරින් එය කළ යුතුය.

ඉහත සියලු සංවර්ධන, නවීකරණ සහ ආයෝජන සාර්ථක කරවීම සඳහා ජනතාවට නිදහස දිය යුතුය. එමෙන්ම එම සංවර්ධනයන් තුළින් නැවතත් ජනතාවගේ නිදහස වඩාත් ශක්තිමත් වෙනු ඇත.

## 4.1. ආර්ථික නිදහස පුළුල් කිරීම

ලංකාවේ ආර්ථික නිදහසේ වේගවත්ම වර්ධනය සිදු වූයේ මහින්ද චින්තන දශකය තුළ යුද්ධය අවසන් කිරීමෙන් පසුවය.

ඕනෑම පුරවැසියෙකුට තම අභිමතය පරිදි රැකියා කිරීමටත්, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ පරිභෝජනය කිරීමටත්, ධනය ආයෝජනය කිරීමටත් ඉඩ සැලසෙන පරිදි ආර්ථික නිදහස පුළුල් කිරීම අපගේ ප්‍රතිපත්තියයි.

ඉහත සහසබැඳි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මෙරට සහ පිටරට වෙසෙන ලාංකිකයන් ආර්ථිකයට සක්‍රීයව දායක විය යුතුය. ඒ සඳහා ඇති ව්‍යුහාත්මක, නියාමක සහ නීතිමය බාධා ඉවත් කර නූතන ලෝකයට ගැලපෙන ආකාරයට ප්‍රතිසංවිධානය කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේද වෙළඳපොළ ඒකාධිකාරයන් ඇති වීමට ඉඩ අවම කරන අතර ශ්‍රමය, භාණ්ඩ හා ප්‍රාග්ධනය සාධාරණව හා තරගකාරීව හුවමාරු වන වෙළඳපොලක් නිර්මාණය කිරීමට කටයුතු කරනු ලැබේ.

පුද්ගලයන් සතු භෞතික දේපළ සහ බුද්ධිමය දේපළ සඳහා ඇති රාජ්‍ය සහ නීතිමය ආරක්ෂාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ශක්තිමත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඊළඟ දශකය තුළ බදු බර ක්‍රමයෙන් අඩු කර පහළ තනි ඉලක්කමකට ගෙන ඒමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම දේශීය ව්‍යවසායකයා ආරක්ෂා වන පරිදි ආනයන සහ අපනයන මත පනවන තීරුබදු සහ වෙනත් සීමා හැකි තාක් අවම කර භාණ්ඩ හා සේවා හුවමාරුව පහසු කරනු ලැබේ.

ව්‍යවසායකයන් හට අලුතෙන් ව්‍යාපාර ආරම්භ කිරීමටත්, ඒවා වේගයෙන් දියුණු කරමින් පවත්වා ගෙන යාමටත් ඇති බාධා ඉවත් කර රාජ්‍ය නියාමනය විධිමත් කරනු ලැබේ.

රටේ ශ්‍රම සම්පත උපරිම ඵලදායීතාවයෙන් යොදා ගැනීම සඳහා ඇති නියාමක සහ නීතිමය බාධා ඉවත් කර ශ්‍රමිකයන්ගේ නිදහස වඩාත් පුළුල් කරනු ලැබේ.

දේශීය සහ විදේශීය ආයෝජන සඳහා ඇති නියාමක සහ නීතිමය බාධා අවම කර පහසුකම් සපයනු ලැබේ.

රාජ්‍යයේ ආර්ථික ක්‍රියාවලිය පාලනය කිරීමෙන් ආණ්ඩුව හැකි තාක් වළකින අතර ජාතික අවශ්‍යතා, පුද්ගල සහ ව්‍යාපාර නිදහස ආරක්ෂා කිරීම සඳහා නියාමනය ශක්තිමත් කරනු ලැබේ.

## 4.2. දේශපාලනික නිදහස

ජනරජයේ සෑම වැසියෙකුටම සමාන පරමාධිපත්‍යයක් හිමිය. එය අත්හළ නොහැකිය. ඒ අනුව ජනරජයේ කටයුතු විය යුතු ආකාරය හෙවත් දේශපාලනය පිළිබඳව තමන් කැමති අදහසක් දැරීමටත්, එම අදහස් ප්‍රකාශ කිරීමටත්, එම අදහස් අනුව දේශපාලන පක්ෂයකට බැඳී ක්‍රියා කිරීමටත් සෑම වැසියෙකුටම සමාන අයිතියක් තිබිය යුතුය. දේශපාලනික නිදහස යනුවෙන් අප හඳුන්වන්නේ එයයි.

නමුත් ඉතිහාසයේ වරින් වර සිදු වූවාක් මෙන් ඇතැම් පුද්ගලයන් විසින් වෙනත් පුද්ගලයන්ගේ, දේශපාලනික නිදහස මර්දනය කරන අවස්ථා උද්ගත වේ. උදාහරණයක් ලෙස කිසියම් දේශපාලන මතයක් දැරීම සහ ප්‍රකාශ කිරීම වැළැක්වීමට සමාජ මාධ්‍යයන් තුළ මර්දනකාරී ලෙස ඇතැම් සංවිධානාත්මක පිරිස් ක්‍රියාත්මක වේ. එමෙන්ම වාචික තර්ජන, කායික හිංසන සහ වධ බන්ධනයට ලක් කරමින් පුද්ගලයන්ගේ දේශපාලනික නිදහස අවුරා දැමීමට ඇතැම් පිරිස් ක්‍රියාත්මක වේ.

නූතන ලෝකයට නොගැලපෙන එම අශිෂ්ට ප්‍රවණතාවය වහාම සහ ස්ථිරව පාලනය කර රටේ සෑම වැසියෙකුගේම දේශපාලනික නිදහස ඒකාන්තයෙන්ම ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

සෑම වැසියෙකුගේම භාෂණයේ නිදහස ආරක්ෂා කරන අතර එමගින් වෙනත් කිසිදු වැසියෙකුගේ භාෂණයේ හෝ වෙනත් කිසිදු නිදහසක් අවහිර වීමට කිසිදු ඉඩක් නොලැබෙන පරිදි නීතියේ ආධිපත්‍යය තහවුරු කරනු ලැබේ.

ජනරජයේ කටයුතු පිළිබඳව වැසියන් දරන විවිධ සහ වෙනස් අදහස් අතරින් වඩාත් සාර්ථක අදහස තෝරා ගැනෙන්නේ සාමකාමී හා තාර්කික විවාදයෙන් පසුව නිදහස් හා සාධාරණ ඡන්දයෙනි. එනම් ප්‍රජාතන්ත්‍රවාදයෙනි. වැසියන් බිය ගැන්වීමෙන් සිය දේශපාලන අරමුණු ඉටු කර ගන්නා ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට වහාම කටයුතු කරනු ලැබේ.

එමෙන්ම ජනරජයේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රමවේද සහ ව්‍යුහයන් පනවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වඩාත් ශක්තිමත් කර ජනතාවගේ දේශපාලනික නිදහස ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබේ.

ඒ සඳහා පාසලේ සිට විශ්ව විද්‍යාල දක්වා **දේශපාලන අධ්‍යාපනය** විෂය නිර්දේශයන්ට ඇතුළත් කරනු ලැබේ.

එමෙන්ම ඇතැම් අධ්‍යාපන සහ සේවා ආයතන තුළ ක්‍රියාත්මක වන දේශපාලනික මර්දනයන් සදහටම අවසන් කර සෑම වැසියෙකුටම සිය දේශපාලනික නිදහස සම්පූර්ණයෙන් භුක්ති විඳීමට හැකියාව සහතික කරනු ලැබේ.

## 4.3. සංස්කෘතික නිදහස

කෙතරම් ආර්ථික වර්ධනයක් ලබා ගත්තත්, ඒ තුළ සංස්කෘතික වටිනාකම් සහිත ජන සමාජයක් නැත්නම් ඉන් ඵලක් නැත.

ජනරජයේ ජීවත් වෙන සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර්, ආදිවාසී වැදි ඇතුළු ඕනෑම ජාතියකට අයත් වැසියන්ට ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවයන් දැරීමටත්, ප්‍රගුණ කිරීමටත් සමාන නිදහසක් තිබේ.

එමෙන්ම එක් සංස්කෘතික අනන්‍යතාවයක් දරන අය විසින් වෙනත් සංස්කෘතික අනන්‍යතාවයක් පහත් හෝ උස් හෝ වශයෙන් සංසන්දනය නොකර ඒ ඒ ප්‍රජාවන්ගේ සංස්කෘතික මූලයන් සහ විශ්වාස මත ගොඩ නැගුණු උත්සව සහ පිළිවෙත් අනෙක් ප්‍රජාවන්ට බාධාවක් නොවන අයුරින් සාමකාමීව සිදු කිරීමට හැකි වන පරිදි කටයුතු කරනු ලැබේ.

එමෙන්ම විවිධ සංස්කෘතීන් අතර අන්තර් සම්බන්ධතා සඳහා අවස්ථා වැඩි කිරීමෙන් එම සංස්කෘතික ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීමට කටයුතු කරනු ලැබේ. එම මානව සහසබැඳියාවන් තුළින් සුන්දර සංස්කෘතික නව්‍යකරණයන් බිහි වෙනු ඇති බව අපගේ විශ්වාසයයි.

එම අන්තර් සම්බන්ධතාවයට බාධා විය හැකි භාෂාමය සහ වෙනත් ව්‍යුහාත්මක බාධක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් හැකි තාක් අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

එපමණක් නොව ජනරජයේ සංස්කෘතික සුන්දරත්වය ලොවට විදහා පෑම සඳහා කලාත්මක සහ ප්‍රාසාංගික අවස්ථා නිර්මාණය කරනු ලැබේ.

## 4.4.ආගමික නිදහස

ජනරජයේ සෑම වැසියෙකුටම බෞද්ධ, හින්දු, කතෝලික, ක්‍රිස්තියානි, ඉස්ලාම් හෝ වෙනත් ආගමක්, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමටත්, වැළඳ ගැනීමටත්, ප්‍රගුණ කිරීමටත්, හුදෙකලාව හෝ අන් අය සමග ප්‍රකාශ කිරීමටත් සමාන නිදහසක් තිබේ.

මනුෂ්‍යයාගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා ආගමික ඉගැන්වීම් තුළින් විශාල පිටුබලයක් ලැබේ. එමෙන්ම සමාජයක ජීවත් වීමේදී පොදු යහපත සඳහා පිළිපැදිය යුතු සදාචාරාත්මක ගුණධර්ම ආගම් තුළින් ඉගැන්වේ.

නමුත් ඇතැම් ආගමික ඉගැන්වීම් මගින් අන්‍යාගමිකයන්ට එරෙහිව සිය අනුගාමිකයන් වරදට පොළඹවන අවස්ථාද තිබේ. එබැවින් ආගමික ඉගැන්වීම් සෑම විටම පුද්ගලයාගේ සහ සමාජයේ යහපත වෙනුවෙන්ම පවතින ආකාරයට සිදු වෙන බවට සහතික කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

එපමණක් නොව විවිධ ආගමික ඉගැන්වීම් පිළිබඳව මූලික අධ්‍යාපනයක් සෑම වැසියෙකුටම ලබා දීම තුළින් මෙන්ම සාමකාමීව සහ ගෞරවාන්විතව සංවාද කිරීමෙන් විවිධ ආගමික විශ්වාස සහ දර්ශන පිළිබඳව සෑම වැසියෙකුටම පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි නිදහස් පරිසරයක් නිර්මාණය කරනු ලැබේ.

ඉහත ආර්ථික වර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය තරගකාරීත්වය හේතුවෙන් පුද්ගලයන් තුළ මානසික පීඩනයක් ඇති වේ. එමෙන්ම සියලු මනුෂ්‍යයන්ට පොදු යස-අයස, නින්දා-ප්‍රශංසා, ලාභ-අලාභ, සැප-දුක ධර්මතාවයන්ට මුහුණ දීමටද පන්සල්, කෝවිල්, දේවස්ථාන, පල්ලි වැනි ආගමික ස්ථාන සහ ඒවායේ පූජ්‍ය පක්ෂය විසින් සිදු කරන සමාජ මෙහෙවර අති විශාලය.

එබැවින් එම ආගමික ස්ථාන ආරක්ෂාකර වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

# ඊළඟ පියවර...

මෙම ප්‍රතිපත්තිමය ඉලක්ක සහ නව්‍යකරණ වැඩපිළිවෙළ තුළ ඇත්තේ රාජ්‍ය සංවර්ධන ඉලක්ක සහ ඒවා සාක්ෂාත් කර ගන්නා මූලික උපායමාර්ගයන්ගේ සාරාංශයක් බව ඔබට පැහැදිලි විය යුතුය. මෙය මහපොළොවේ යථාර්ථයක් කිරීමට නම් අප සියලු දෙනා එකාවන්ව එකම අධිෂ්ඨානයෙන් අපේ රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් වෙහෙසිය යුතුය.

මෙම ප්‍රතිපත්ති මත පදනම්ව එක් එක් ඉලක්ක සහ උපායමාර්ග සඳහා නිශ්චිත වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. එය අමාත්‍යංශ සහ අදාළ රාජ්‍ය ආයතන මට්ටමෙන් සිදු කරනු ඇත. එම වැඩසටහන් සඳහා ඔබගේ සක්‍රීය දායකත්වය අපි බලාපොරොත්තු වන්නෙමු.

අපගේ මාතෘභූමියේ නැවත කිසි දිනෙක යුද්ධයක් ඇති වීමට අපි ඉඩ නොතබන්නෙමු. එමෙන්ම නැවත කිසි දිනෙක බාහිර හේතූන් මත හෝ ආර්ථික අර්බුදයක් ඇති වීමටද අප ඉඩ තබන්නේ නැත. ඔබ වෙනුවෙන් දියුණු රටක් හදන මාගේ දැක්ම සහ අප පක්ෂයේ හැකියාව කෙරෙහි විශ්වාසය තබා ඔබගේ වටිනා ඡන්දය මා වෙනුවෙන් ලබා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**නාමල් රාජපක්ෂ**
நாமல் ராஜபக்ச
**Namal Rajapaksa**

X

